භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
ශ්‍රී ලංකා

වාර්ෂික වාර්තාව
2015

වාර්ෂික වාර්තාව
2015

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.
දු.ක: 011 2886289/ 0112886290
ෆැක්ස් : 001 2886273
විද්‍යුත් තැපෑල : info@gsmb.gov.lk
වෙබ් අඩවිය : www.gsmb.gov.lk

ආයතනික තොරතුරු

පොදු

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය 1992 අංක 33 දරණ පතල් හා ඛණිජ පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර එහි ප්‍රධාන කාර්යාලය අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ යන ස්ථානයේ පිහිටා ඇත. මාතර, නුවර, කුරුණෑගල, රත්නපුරය, අනුරාධපුරය, පොළොන්නරුව, බදුල්ල, මොනරාගල, අම්පාර, හම්බන්තොට, ත්‍රිකුණාමලය, කන්තලේ, මඩකලපුව, යාපනය, කළුතර සහ ගම්පහ යන නගරවල ප්‍රාදේශීය කාර්යාල 14ක් පිහිටා ඇත.

දැක්ම හා මෙහෙවර

දැක්ම

භූ විද්‍යාත්මක තොරතුරු ගවේෂණය සහ ව්‍යාප්තිය සිදු කරන බොහෝ සෙයින් කල් පවත්නා ආකාරයෙන් ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් කැනීම් ක්‍රියාවලිය නියාමනය කරනු ලබන ප්‍රධාන ජාතික භූ විද්‍යා නියෝජිතායතනය වශයෙන් කටයුතු කිරීම

මෙහෙවර

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ මෙහෙවර වන්නේ ප්‍රතිපත්ති සකස් කරන්නන්ට සහ ජනතාවට භූ විද්‍යා තොරතුරු උපදෙස් හා සේවා සැපයීම සහ පාරිසරික වශයෙන් කල් පැවැත්ම පවත්වාගැනීමට වග බලා ගනිමින් ආර්ථික සංවර්ධනය වෙනුවෙන් රටේ ඛනිජ සම්පත් කළමනාකරණය සහ ප්‍රවර්ධනය කිරීමයි. ඛනිජ ගවේෂණය, නිස්සාරණය, වටිනාකම එකතු කිරීම, ප්‍රවාහනය සහ වෙළඳාම නියාමනය කිරීමද එය සිදු කරයි.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ කාර්යයන්

- ශ්‍රී ලංකාවෙහි ක්‍රමවත් භූ විද්‍යා සිතියම් සැකසීම භාර ගැනීම සහ භූ විද්‍යා සිතියම් සකස් කිරීම.
- ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් හඳුනාගැනීම සහ ඒවා තක්සේරු කිරීම.
- ඛනිජ සඳහා පතල් කැනීමේ වාණිජමය ස්වශක්තිතාව පිළිබඳව ඇගයීම සහ ඛනිජ සකස් කිරීම හා අපනයනය කිරීම.
- ඛනිජ සඳහා ගවේශණ කිරීම හා පතල් කැනීම, ගබඩා කිරීම සහ ඒ ඛනිජ සකස් කිරීම, ප්‍රවාහනය,ගබඩා කිරීම, වෙළඳාම හා අපනයනය කිරීම, බලපත්‍ර නිකුත් කිරීම මගින් විධිමත් කිරීම.
- ඛනිජ ද්‍රව්‍ය පදනම් වූ නිෂ්පාදන සංවර්ධනය කිරීම මගින් ඒවා ප්‍රවර්ධනය කිරීම, නිශ්කර්ෂණය කිරීම,වටිනාකම් එකතු කිරීම සඳහා සහ වාණිජමය පදනමක් මත එකී ඛණිජ ද්‍රව්‍ය පදනම් වූ නිෂ්පාදන අපනයනය සඳහා උපයෝගී කරගත යුතු පියවර පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම.
- පනත (අ), (ආ) සහ (ඇ) ඡේද යටතේ වූ කර්තව්‍ය ඉටු කිරීමේදී ලබා ගත් තොරතුරු සහ දත්ත උචිත මාධ්‍ය මගින් පතල කිරීම.
- ඉංජිනේරු භූ විද්‍යාව හා සම්බන්ධ ව්‍යාපෘති භාර ගැනීම සහ භූ විද්‍යාත්මක ආපදා සහ ව්‍යසන සම්බන්ධයෙන් ප්‍රතිකර්ම වශයෙන් ගතයුතු පියවර පිළිබඳව උපදෙස් ලබා දීම

පටුන

සභාපතිතුමාගේ පණිවිඩය	07
අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවිඩය	09
කළමනාකාරිත්ව මණ්ඩලය	11
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	11
කාර්යාංශය ගැන	12
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හා සම්බන්ධ විය හැකි ආකාරය පිළිබඳ තොරතුරු	14
ඓතිහාසික පසුබිම	16
ආංශයික කාර්යසාධනය	
භූ විද්‍යා අංශය	17
කැනීම් අංශය	30
මූල්‍ය සමාලෝචනය	38
නීති අංශය	39
මානව සම්පත් පිළිබඳ සමාලෝචනය	40
ආයතනික පාලනය	42
මුල්‍ය වාර්තා	43
මුල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	49
මුල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය	50
මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	51
විගණකාධිපති වාර්තාව	71
විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු	87
විගණන කමිටු වාර්තාව	95
ආයතනික සමාජ වගකීම්	97

සභාපතිතුමාගේ පණිවුඩය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සභාපතිවරයා ලෙස 2015 වර්ෂය වාර්ෂික වාර්තාව සඳහා මෙම කෙටි පණිවුඩය මා විසින් නිකුත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි. 2015 වර්ෂය තුළදී කාර්යාංශය විසින් ලබා ගන්නා ලද ප්‍රධාන ජයග්‍රහණයන් සිහිපත් කිරීමට මම මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගනිමි.

මනුෂ්‍යවර්ගයාගේ සුභසෙත සඳහා ඛනිජ ඉතාම අත්‍යවශ්‍ය වේ. කෙසේ වුවද ඛනිජ නිස්සාරණය කිරීමට ලැබීම ඉතා හොඳ අවස්ථාවක් මෙන්ම අභියෝගකාරී කටයුත්තක් ද වේ. කැනීම් අංශයෙහි ඇති තරඟකාරී බව සහ සේවා තත්ත්වයන් පිළිබඳ පෙර සිට පැවත එන ගැටලු සමුදායට තවත් අළුත් ගැටලු සමුදායක් එකතු වී ඇත. අද දවසේ පුළුල් අරමුණ වී ඇත්තේ කැනීම් අංශයට තිරසාර සංවර්ධනයක් ඇති කර ගත හැකි ක්‍රමවේදයක් සොයා බැලීමයි.

තිරසාර සංවර්ධනය යන්න නිරන්තරවම අර්ථ නිරූපනය කරනු ලබන්නේ තම අවශ්‍යතාවයන් සපුරා ගැනීමට අනාගත පරපුර සතු හැකියාව දුර්වල නොකරමින් වර්තමාන අවශ්‍යතා සපුරාලනු ලබන සංවර්ධනයකි.'' තවද මේ තුළ ආර්ථික පාරිසරික හා සමාජීය වශයෙන් අවධානය යොමු කළ යුතු කරුණුද අන්තර්ගත විය යුතු බව පොදුවේ පිළිගනු ලබන මතයකි.

අපේ දැක්ම වනුයේ ශ්‍රී ලංකාව තුළ ඛනිජ කැනීම් හා සැකසීම් කටයුතු හා ආශ්‍රිත පාරිසරික හා සමාජ විද්‍යාත්මක ගැටළු සඳහා විසඳුම් ලබා දෙන අතරම භූ විද්‍යාත්මක තොරතුරු උත්පාදනය කර බෙදා හරින සහ ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් කැනීම හා සැකසීම නියාමනය කරනු ලබන ප්‍රධානම ජාතික භූ විද්‍යා ආයතනය බවට පත් වීමයි.

මෑත අතීතයේදි සිදු වූ ශීඝ්‍ර සංවර්ධන කටයුතු හේතුවෙන් ඉදි කිරීම් ද්‍රව්‍ය ලෙස ගංගා වැලි සහ කළුගල් සඳහා ඉහළ ඉල්ලුමක් ඇති විය. කැනීම් ස්ථාන ප්‍රධාන පාරට පහසුවෙන් ළඟා විය හැකි ප්‍රදේශවල පිහිටා තිබීම සහ ගංගා වැලි සඳහා විශාල ඉල්ලුමක් තිබීම හා එමගින් විශාල ආදායමක් ලැබිය හැකි හෙයින් ගංගා වැලි කැනීම බහුලව සිදු කරනු ලබන ක්‍රියාවක් බවට පත්ව ඇත. ගංගා වැලි කැනීමේ කටයුතු රට පුරාම ඉහළ ගොස් ඇති අතර එමගින් ගංගා ඉවුරු ඛාදනය වීම, ගංගා පත්ල හායනය වීම, ගංගා අවරෝධක කලාප, ආක්‍රමණය කරනු ලැබීම සහ ගංගා ජලයේ ගුණාත්මක භාවය හා භූගත ජලයේ පැවැත්ම හානියට ලක්වීම සිදුවී ඇත. තවදුරටත් අධික ලෙස ගංගා වැලි කැනීම සිදු කිරීම මගින් මුහුදු ජලය ගංගා තුළට ඇතුළු වී එමගින් ගංගා ජලයේ ලවනතාවය ඉහළ යන අතර එම තත්ත්වය ජාතික ජල සැපයුම් පද්ධතියටද සෘජුවම බලපායි.

කෙසේ වුවද ගංගා වැලි ඉදි කිරීම් කර්මාන්තය සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍යයක් වන හෙයින් ශ්‍රී ලංකාව තුළ ගංගා වැලි කැනීමේ කටයුතු මුළුමනින්ම තහනම් කිරීම අපහසු වේ. ගංගා වැලි කැනීමට අමතරව බොරළු කැනීම සහ ගල් කැඩීම ද ඒ හා සමානව පාරිසරික හා සමාජ විද්‍යාත්මක ගැටළු නිර්මාණය කරයි. එහෙයින් ශ්‍රී ලංකාවේ පාරිසරික, සමාජ විද්‍යාත්මක හා ආර්ථික පැතිකඩ සලකා බැලීමේදී තිරසාර කැනීම් ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම ඉතා දැඩි අවශ්‍යතාවයක් වේ.

2015 වර්ෂය තුළදී කැනීම් සහ ගල් කැඩීම යන කටයුතු මගින් ජාතික ආර්ථිකයට 3% ක දායකත්වයක් ලබා දෙන ලද අතර එය 11% ක වර්ධන අනුපාතයක් පෙන්නුම් කරයි. ඛනිජ අපනයන අංශයද ජාතික ආර්ථිකයට සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය එකතු වී ශ්‍රී ලංකාවේ පරිසරය හා එහි ජීවත් වන සියළු පුද්ගලයන් ආරක්ෂා කරමින් වඩාත් තිරසාර ආකාරයකින් කැනීම් අංශය දියුණු කරනු ඇතැයි ඉහළ බලාපොරොත්තුවක් ඇත.

පසුගිය වර්ෂවලදී සම්පූර්ණ කරන ලද 1 : 100,000 භූ විද්‍යා සිතියම් මත පදනම් වී 1 : 250,000 පරිමාණයේ පාදස්ථ සිතියම් 4 ක් නිර්මාණය කිරීමට භූ විද්‍යා අංශයට හැකි විය.

පසුගිය වර්ෂවලදී නිර්මාණය කරන ලද 1 : 100,000 පරිමාණයේ සිතියම් පාදක කරගෙන 1: 250,000 පරිමාණයේ පාදස්ථ භූ විද්‍යා සිතියම් 4 ක් නිර්මාණය කිරීමටද භූ විද්‍යා අංශයට මේ වර්ෂයේදී හැකියාව ලැබුණි. මෙම සිතියම් හතර මගින් සමස්ත දිවයිනම ආවරණය කරනු ලබන අතර අවසානයේදී එය සමස්ත දිවයිනම ආවරණය කරන 1: 500,000 පරිමාණයේ සිතියමක් ලෙස යාවත්කාලීන කරනු ඇත. පළාත් ඛනිජ සිතියම් නම් වූ නව සිතියම් වැඩසටහනක්ද කාර්යාංශය විසින් ආරම්භ කර ඇති අතර මෙම සිතියම් මාලාව යටතේ දැනට පවතින දත්ත මත සහ අතිරේක ක්ෂේත්‍ර පරීක්ෂණ මත පදනම්ව සිතියම් න්‍යායක් පිළියෙල කරනු ඇත.

2015 වර්ෂය තුළදී වියදම ඉකුත් කළ විට ආදායම ලෙස රු. 1,037,093,870.42 ක මුදලක් ලබා ගනු ලැබූ අතර රු. 1,556,379780.10 ක කැනීම් ආදායම, රු. 33,998,019.35 ක භූ විද්‍යා ආදායම සහ රු. 125,426,991.71 ක අනිකුත් ආදායම් එයට ඇතුළත් වේ. පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේදී ලබා ගත් ලාභය රු. මිලියන 1037 ක් වූ අතර එය 25.5% ක වැඩි වීමකි. සමාලෝචිතව වර්ෂය තුළදී කාර්යාංශයේ ආදායම රු. මිලියන 1715 ක් වූ අතර එය 13.6% ක වර්ධනයකි. (2014 රු. මිලියන 1510) මහා භාණ්ඩාගාරයට රු. මිලියන 850 ක් ලබා දීමටද හැකියාව ලැබුණු බව මා ප්‍රකශ කරනුයේ ඉමහත් ප්‍රීතියෙනි.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ කළමනාකාරිත්ව මණ්ඩලය අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ කාර්ය මණ්ඩලය විසින් කාර්මික හා ඉදිකිරීම් අංශය තුළ තිරසාර අරමුණු සපුරා ගැනීම සඳහා ගන්නා ලද අප්‍රතිහත උත්සාහය මම ඉමහත් කෘතවේදී ලෙස සිහිපත් කරමි.

ස්තුතියි

ආචාර්ය කිත්සිරි දිසානායක

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

සිතියම් හා අනිකුත් ආකෘතීන් ආකාරයෙන් වැදගත් භූ විද්‍යා තොරතුරු ජනනය කිරීම හා බෙදා හැරීම සහ කැනීම් කටයුතු නියාමනය කිරීම කාර්යාංශයේ ප්‍රධාන කටයුතු තුළට ඇතුළත් වේ. කාර්යාංශයේ ආයතනික අරමුණු සපුරා ගැනීම සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම එහි ප්‍රධාන තාක්ෂණික අංශයන් වන භූ විද්‍යා සමීක්ෂණ අංශය සහ කැනීම් අංශය හරහා ක්‍රියාත්මක කරනු ලැබේ.

පසුගිය වර්ෂ වලදී සම්පූර්ණ කරන ලද 1 : 500,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් මත පදනම්ව 1 : 250,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් 4 ක් නිර්මාණය කිරීමට භූ විද්‍යා අංශයට හැකි විය. මෙම සිතියම් හතර මගින් මුළු දිවයිනම ආවරණය කරනු ලබන අතර අවසානයේදී රටෙහි 1: 500,000 පරිමාණයේ තනි සිතියම් ලෙස යාවත්කාලීන කර එය ඉදිරිපත් කරනු ඇත. භූ විද්‍යා සමීක්ෂණ අංශය විසින් ක්‍රියාත්මක කරන ලද තවත් වැදගත් වැඩසටහනක් වනුයේ අවුරුදු මිලියනය (02) දෙකකට වඩා වයසින් අඩු අවසාදිත සැකසීම් සිතියම්ගත කිරීමයි. (චාතුර්ථික අවදිය) මෙම 1 : 50,000 පරිමාණයේ සිතියම් විශේෂ වශයෙන්ම වෙරළ අවසාදිතයන් සහ දියළු අවසාදිතයන් බොහොමයක් ආවරණය කරයි. මෙම වැඩසටහන යටතේ කල්පිටිය හා විල්පත්තු කලාපවල ක්ෂේත්‍ර සිතියම් කටයුතු සම්පූර්ණ කරන ලද අතර 1 : 50,000 පරිමාණයේ චාතුර්ථික සිතියම් 03 ක් මුද්‍රණය සඳහා සකසන ලදී. 2015 වර්ෂයේදී කැකිරාව සහ පොළොන්නරුව 1 : 50000 කලාප ආවරණය කරමින් පස් නියැදි 1000 ක් පමණ එකතු කර ගන්නා ලදී. කිඩොල්කැටිය, හම්බන්තොට, මොරවක, රක්වාන, තංගල්ල සහ මාතර යන 1:50,000 කලාපවලට අදාල විශ්ලේෂණ කටයුතු සම්පූර්ණ කරන ලදි. නව පරමාණුක අවශෝෂක වර්ණාවලිමානයක් සහ රසදිය විශ්ලේෂකයන් එක් කිරීම තුලින් විශ්ලේෂණ විද්‍යාගාරය නවීකරණය කරන ලදි. ඔස්ට්‍රියාවේ වියානා නුවර පිහිටි අන්තර්ජාතික පරමාණු බල ශක්ති නියෝජිතායතනයේ අර්ධ මූල්‍ය අනුග්‍රහය යටතේ නවීන එක්ස් කිරණ ෆ්ලුවරොසයින් වර්ණාවලි මානයක්ද ලබා දෙන ලදි.

පළාත් ඛනිජ සිතියම් නම් වු නව සිතියම් පිළියෙල කිරීමේ වැඩසටහනක්ද කාර්යාංශය විසින් ආරම්භ කර ඇත. මෙම සිතියම් මාලාව යටතේ සිතියම් නවයක් පිලියෙල කරනු ලබන අතර දැනට පවතින දත්ත සහ අතිරේක ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු මත පදනම්ව එම කාර්යය ඉටු කරනු ඇත. මෙම සිතියම් මාලාවේ පළමුවැන්න ලෙස මධ්‍යම පළාත් ඛනිජ සිතියම සකස් කරන ලද අතර සබරගමුව පළාත් ඛනිජ සිතියම පිළියෙල කරනු ලබමින් පවති.

රජයේ හා පුද්ගලික අංශයේ ආයතනවල ඉල්ලීම මත ඛනිජ ගවේෂණ, දියමන්ත සිදුරු විදීම් සහ භූ තාක්ෂණික පරීක්ෂණ කටයුතු පිලිබඳ ව්‍යාපෘති කිහිපයක් කාර්යාංශය විසින් සිදු කරන ලද අතර මෙම ව්‍යාපෘති වලින් උපයන ලද ආදායම රුපියල් මිලියන 20 ක් පමණ විය.

කාර්යාංශය විසින් සිදු කරනු ලබන නියාමන කටයුතු පිළිබඳ වගකීම ප්‍රධාන වශයෙන්ම දරනු ලබන්නේ කැනීම් අංශය විසිනි. 2015 අප්‍රේල් මාසයේදී පොලොන්නරුව ප්‍රාදේශීය කාර්යාලය නැවත ස්ථාපනය කිරීමත් සමඟ කාර්යාංශය සතු මුළු ප්‍රාදේශිය කාර්යාල සංඛ්‍යාව 15 ක් බවට පත් විය. ගවේෂණය, කැනීම, ඛනිජ ප්‍රවාහනය සහ පාරිසරික අධීක්ෂණය නියාමනය කිරීම හා සම්බන්ධව ඇති විවිධත්වය සහ සංකීර්ණතාවය මත සමාජ - පාරිසරික ගැටළු හා නීතිවිරෝධී කැනීම් හේතු කොටගෙන ඇති වන අභියෝගවලට අඛණ්ඩව මුහුණ පෑමට මෙම කාර්යාංශයට සිදු විය. අදාළ අනිකුත් ආයතන විසින් පාරිසරික නිෂ්කාෂණ සහතික ලබා ගත යුතු බවට කාර්යාංශය විසින් අවධාරණය කරනු ලැබ තිබුනද කැනීම් කටයුතු නිසා ඇතිවන අහිතකර පාරිසරික හා සමාජ බලපෑම් පිළිබඳව බොහෝ අවස්ථාවලදී කාර්යාංශය දෝෂාරෝපණයට ලක් වෙයි. කෙසේ වුවද කාර්යාංශයේ ශක්තීන් හා දුර්වලතාවයන් පිලිබඳ විශ්ලේෂණය කර බැලීමේදී පෙනී යන්නේ බලපත්‍ර ලබා දුන් පසු සිදු කළ යුතු අධීක්ෂණ කටයුතු සැලකිය යුතු ලෙස ශක්තිමත් කළ යුතු බව සහ නීති විරෝධී කැනීම් කටයුතු සහ ඛනිජ ප්‍රවාහනය අවම කිරීම සඳහා කාර්යසාධක යාන්ත්‍රණය හඳුන්වා දිය යුතු බවයි.

සැබවින්ම මීට අවුරුදු 23කට පෙර කාර්යාංශය ස්ථාපිත කරන ලද දිනයේ සිටම පවතින වර්තමාන සේවක සංඛ්‍යාව සහ ආයතනික ව්‍යුහය වහාම ප්‍රතිශෝධනය කළ යුතු වේ. නීති විරෝධී ඛනිජ කැනීම් සහ ඛනිජ ප්‍රවාහනය අවම කිරීම සඳහා නවීන තාක්ෂණය හඳුන්වාදීමට ඇති හැකියාව පිලිබඳව විමසා බැලීමට 2015 වර්ෂය තුළදී සාකච්ඡා ගණනාවක් පවත්වන ලදී. මෙම සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස ඉහළ ආරක්ෂණ අංග සහිත පරිගණකගත ප්‍රවාහන බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දීමට පියවර ගන්නා ලදී. එම අරමුණම පෙරදැරි කරගෙන නීති විරෝධී කැනීම් කටයුතු පිලිබඳව කැනීම් සිදු කරන ප්‍රජාව සහ පොලීසිය දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. දුෂ්කර තත්ත්වයන් මධ්‍යයේ වුවද කැනීම් කටයුතු සහ රටේ කර්මාන්ත හා යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා අවශ්‍ය ඛනිජ අමුද්‍රව්‍ය ප්‍රවාහනය නියාමනය කිරීම සඳහා සාර්ථක ලෙස කටයුතු කිරීමට කැනීම් අංශය සමත් විය. මූල්‍යමය පැතිකඩ පිළිබඳව සාකච්ඡා කිරීමේදී රු. මිලියන 1715 ක මුළු ආදායමක් ඉපැයීමට කාර්යාංශයට හැකි වූ අතර ඉන් රු. මිලියන 850 ක් මහා භාණ්ඩාගාරයට ලබා දෙන ලදී.

අවසාන වශයෙන් 2015 වර්ෂය තුළදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සිය ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධයෙන් සතුටුදායක ප්‍රගතියක් ලබා ගෙන ඇති බව සතුටින් ප්‍රකාශ කරන අතර මෙම වර්ෂය තුළදී ගන්නා ලද ව්‍යායාම තුලින් ඉදිරි වර්ෂ වලදී ද සාධනීය ප්‍රතිඵල ලැබෙනු ඇති බවට මම විශ්වාස කරමි.

ආචාර්ය ඩබ්. කේ. බී. එන්. ප්‍රේම්

කළමනාකාරිත්ව මණ්ඩලය

සභාපති	ආචාර්ය කිත්සිරි දිසානායක මහතා
සාමාජිකයන්	ආචාර්ය ඩබ්. කේ. බී. එන්. ප්‍රේම් මහතා පී. අල්ගම මහතා එන්. කේ. පී. කේ. නැම්මවත්ත මහතා කොල්මන් පී. පෙරේරා මහතා ඩබ්. ටී. එච්. ආර්. විතාන මහතා
මණ්ඩලයේ ලේකම්	එම්. එස්. කේ. ප්‍රනාන්දු මහත්මිය

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

සභාපති	:	ආචාර්ය කිත්සිරි දිසානායක මහතා
අධ්‍යක්ෂ ජනරාල්	:	ආචාර්ය ඩබ්. කේ. බී. එන්. ප්‍රේම් මහතා
සාමාන්‍යාධිකාරී	:	එම්. ඩබ්. ජයමාන්න මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ (භූ විද්‍යා)	:	ආචාර්ය සී. එච්. ඊ. ආර්. සිරිවර්ධන මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කැනීම්)	:	ඉංජිනේරු ඩී. සජ්ජන ද සිල්වා මහතා

කාර්යාංශය ගැන

1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත යටතේ සේවාවන් ලබා දීම සඳහා පිහිටුවන ලද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඛනිජ සංවර්ධනය සඳහා කටයුතු කරනු ලබන ප්‍රමුඛතම ආයතනය වන අතර ඛනිජ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා රජය සතු කැපවීම මෙම ආයතනය මගින් අවධාරණය කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ඛනිජ සංවර්ධනය සඳහා බලයලත් ආයතනය වන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මේ දක්වා ඛනිජ ගවේෂණ කටයුතු සිදු කර රටට ඉමහත් ප්‍රතිලාභ අත්පත් කර දී ඇත.

ශ්‍රී ලංකාව කුඩා රටක් වන හෙයින් එහි උප පෘෂ්ඨීය ඛනිජ සම්පත ද ඒ හා සමානවම කුඩා වේ. එහෙයින් මෙම ආයතනය විසින් ඛනිජ ආශ්‍රිත කර්මාන්ත ආරම්භ කිරීමට දිරිගන්වන අතරම ඛණිජ යනු පුනර්ජනනීය නොවන වාණිජ භාණ්ඩයක් වන හෙයින් එය අපතේ යැවීම පිළිබඳව අනතුරු අඟවන අතර එය අරපිරිමැස්මෙන් භාවිතා කළ යුතු බවට අවධාරණය කරනු ලැබේ.

ජාතිය වෙත භූ විද්‍යා ශක්‍යතාවය ලබා දෙන අතරම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පෘථිවි සම්පත්, ඒ ආශ්‍රිත ගැටළු හා ප්‍රශ්න පිළිබඳව අවබෝධය ප්‍රවර්ධනය කිරීමද සිදු කරනු ලැබේ. බහුවිධ වූ විද්‍යා විශේෂඥ දැනුම මගින් බහු - විෂයික පර්යේෂණ කටයුතු ඉටු කිරීමට අපට හැකියාව ලබා දෙන අතර භූ විද්‍යා සිතියම් ඇතුළු විද්‍යාත්මක තොරතුරු සර්ව සාධාරණ ලෙස කළමනාකරුවන්, සැලසුම්කරුවන් සහ අනිකුත් ගනුදෙනුකරුවන් වෙත ලබා දෙනු ලැබේ. පෘථිවිය විස්තර කිරීමට   හා තේරුම් ගැනීමට ස්වාභාවික විපත් මගින් ද සිදුවන දේපල හා ජීවිත හානි අවම කිරීම, භූ විද්‍යා ශක්තිය හා භූ විද්‍යා සම්පත් කළමනාකරණය කිරීම සහ ජීවිතවල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම හා ඉහළ නැංවීම සඳහා භූ විද්‍යා සමික්ෂණ හා පතල් කාර්යාංශය ජාතියට සේවය කරයි.

කාර්යාංශය සතුව මූලික මෙහෙයුම් කටයුතු 4 ක් ඇත. භූ විද්‍යා සිතියම් සැකසීම හා ඛනිජ ගවේෂණය, කැනීම් නාමකරණය හා කැනීම් කටයුතු නියාමනය (ප්‍රධාන කාර්යය) සේවාදායකයන් විසින් පවරනු ලබන කටයුතු (ඛනිජ සම්පත් ගවේෂණයන්, විද්‍යාගාර සේවා, භූ භෞතික හා විදුම් කටයුතු) සහ භූ විද්‍යා තොරතුරු ලබාදීම (ප්‍රසිද්ධ කරන ලද සහ ප්‍රසිද්ධ නොකරන ලද වාර්තා, සිතියම් හා පුස්තකාලයේ ඇති අනිකුත් ලේඛන ලබා දීම) එම කටයුතු වලට අයත් වේ.

නුවර, මාතර, කුරුණෑගල, බදුල්ල, රත්නපුරය, අනුරාධපුරය, අම්පාර, මොනරාගල, හම්බන්තොට, ත්‍රිකුණාමලය, කළුතර, යාපනය, මඩකලපුව, ගම්පහ සහ පොළොන්නරුව යන නගරවල පිහිටි ප්‍රාදේශීය කාර්යාල 15 ක් සහ හසලක හා කන්තලේ පිහිටි උප කාර්යාල දෙකක් හරහා කැනීම් අංශය වර්තමානයේදී ක්‍රියාත්මක වේ. අදාළ පළාත් තුළ විවිධ කැනීම් කර්මාන්තවල නිරත සේවාදායකයන් සඳහා වඩාත් හොඳ සේවාවන් ලබා දීම සහ නීති විරෝධී කැනීම් කටයුතු පාලනය කිරීම මෙම ප්‍රාදේශීය කාර්යාලවල ප්‍රධාන කටයුතු වේ.



භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය තම සේවා කටයුතු රට පුරා ව්‍යාප්ත කරයි.

අනුරාධපුරය, ත්‍රිකුණාමලය, කන්තලේ, පොළොන්නරුව, කුරුණෑගල, මඩකලපුව, නුවර, ගම්පහ, බදුල්ල, මොනරාගල, කොළඹ, රත්නපුරය, කළුතර, මාතර, හම්බන්තොට

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හා සම්බන්ධ විය හැකි ආකාරය පිළිබඳ තොරතුරු

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය - ප්‍රධාන කාර්යාලය

ලිපිනය	**දුරකථන / ෆැක්ස්**
අංක 569, එපිටමුල්ල පාර,	+94-11-2886289
පිටකෝට්ටේ	+94-11-2886290

		සම්බන්ධ විය හැකි ආකාරය	
තනතුරු නාමය :	**නම**	කාර්යාල දුරකථන/ ෆැක්ස්	නිවස/ ජංගම
සභාපති	ආචාර්ය කිත්සිරි දිසානායක	+94 11 2886268	+94 11 2811033
		+94 11 2886194	+94 77 3305157
අධ්‍යක්ෂ ජනරාල්	ආචාර්ය ඩබ්.කේ.බී.එන්. ප්‍රේම්	+94 11 2886271	+94 11 2868768
		+94 11 2886276	+94 77 7593408
සාමාන්‍යාධිකාරී	එම්. ඩබ්. ජයමාන්න	+94 11 2887826 +94 11 2886273	
නියෝජ්‍ය අධ්‍යක්ෂ (භූ විද්‍යා)	ආචාර්ය සී. එච්. ඊ. ආර්. සිරිවර්ධන	+94 11 2886287	+94 33 2227439
		+94 11 2887825	+94 71 8063205
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කැණීම්)	දේශමාන්‍ය ඩී. සජ්ජන ද සිල්වා	+94 11 2886270	+94 91 2264910
		+94 11 2886269	+94 77 7315452

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය - ප්‍රාදේශීය කාර්යාල

අපගේ කාර්යාල	ලිපිනය	කාර්යාල ප්‍රධානී	දුරකථනය
අම්පාර	අංක 669, නව නගරය, අම්පාර	ඉංජිනේරු එච්.ඒ.සී.කේ.ඩබ්. බණ්ඩාර	+94-63-2223385
අනුරාධපුරය	අංක 596/69, බණ්ඩාරනායක මාවත, අනුරාධපුරය	පී. කේ. කරුණානන්ද මහතා	+94-25-2223535
බදුල්ල	අංක 52/ඒ, රත්වත්ත මාවත, බදුල්ල	ඉංජිනේරු ටි. එම්. ඩබ්. බණ්ඩාර	+94-55-2222787 +94 55-2225210
මඩකලපුව	අංක 239, බාර් මාවත, මඩකලපුව	ඉංජිනේරු එච්. ආර්. එම්. ෆාරිස්	+94-65-2222266
හම්බන්තොට	අංක 21, ටෙරස් වීදිය, හම්බන්තොට	ඉංජිනේරු අසංක රූපවංශ	+94-47-2222477
ගම්පහ	අංක 6, වෙරළවත්ත, යක්කල	ඉංජිනේරු එච්. කේ. එම්. ගුණසේකර	+94 -33-2231430
යාපනය	අංක 170, කොළොම්පුතුරෙයි මාවත, යාපනය	ඉංජිනේරු ඩී. මයුරන්	+94-21-2224595
කළුතර	අංක 9 ඒ, පල්ලිය පාර, වෙත්තුමකව, කළුතර දකුණ	ඉංජිනේරු කේ.වී. ජගත්	+94-34-2223743
නුවර	ජනසවිගම, පල්ලෙකැලේ, නුවර	ඉංජිනේරු ධම්මික ප්‍රසාද්	+94-81-2421294 +94-81-2421474
කුරුණෑගල	අංක 15/බී, මීගමුව පාර, මල්කඩුවාව	ඉංජිනේරු එස්. ඒ. අයි. ජේ. රුද්‍රිගු	+94-37-2230858 +94-37-2232542
මාතර	අංක 7, ජයසූරිය මාවත, නුපේ, මාතර	ඉංජිනේරු යූ.එච්.ටී. ප්‍රියන්ත	+94-41-2236765
මොනරාගල	අංක 190/6, වැල්ලවාය පාර, මොනරාගල	ඉංජිනේරු ඩබ්.ජී.එස්. කෝකිල	+94-055-2277392 +94-055-2276882
රත්නපුරය	අංක 66, ශ්‍රී සරණංකර මාවත, හිදෙල්ලන, රත්නපුරය	ඉංජිනේරු ටී.එස්. කුමාර	+94-45-2228117
ත්‍රිකුණාමලය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 4 වන සැතපුම් කණුව, ත්‍රිකුණාමලය	ඉංජිනේරු ඩබ්ලිව්. විමලරත්න	+94-26-3202411 +94-26-2050815

ඓතිහාසික පසුබිම



ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතාගේ නායකත්වයෙන් 1903 දි ස්ථාපිත කරන ලද ඛනිජ සමීක්ෂණ ආයතනයෙන් අරඹා ශත වර්ෂයකට අධික කාලයක් තිස්සේ භූ විද්‍යා දෙපාර්තමේන්තු ගණනාවක් ලෙස ක්‍රියාත්මකව පැවති ආයතනයක සාඩම්බර අනුප්‍රාප්තිකයා ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හැඳින්විය හැකිය. රටෙහි ඛනිජ සම්පත් අනාවරණය කර ගැනීම, ඒවා ප්‍රවර්ධනය කිරීම සහ ඒ පිලිබඳ දත්ත ලබා ගැනීම සම්බන්ධයෙන් සුවිශේෂී සේවා වාර්තාවක් මෙම දෙපාර්තමේන්තු විසින් ඉතිහාසය පුරාම පවත්වා ගෙන ඇති අතර රටෙහි දැනට ක්‍රියාත්මක වන සියළුම ඛනිජ ආශ්‍රිත කර්මාන්ත ඒ සම්බන්ධයෙන් ණය ගැති විය යුතුය.

1939 වර්ෂයේදි ඛනිජ සමීක්ෂණ ආයතනය ඛනිජ විද්‍යා දෙපාර්තමේන්තුව ලෙස නම් කරන ලද අතර ඉන් අනතුරුව 1962 වර්ෂයේදී එය භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව ලෙස නැවත නම් කරන ලදී. 1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත ප්‍රකාරව 1993 මාර්තු 18 දින මෙම කාර්යාංශය ස්ථාපිත කරන ලද අතර භූ විද්‍යා සමීක්ෂණ කටයුතු නව වගකීම් ද සමග නවීන පතල් දෙපාර්තමේන්තුවක් වෙත අනුයුක්ත කරන ලදි.

ඛනිජ සංවර්ධනය සඳහා වන ප්‍රධානතම ආයතනය ලෙස මෙම කාර්යාංශය පිහිටුවීම මගින් ඛනිජ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා රජය සතු කැපවීම අවධාරණය කරනු ලැබේ. මිල අධික ආනයනයන් සඳහා ආදේශකයන් ලබා දෙන, ගොඩනැගිලි හා ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය භාණ්ඩ ලබා දෙන සහ අපනයන කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දෙන ඛනිජ රට තුළ රැකියා අවස්ථා නිර්මාණය කිරීම සහ රටට ආදායම උපදවා දීම සිදු කරයි. ජාතික භූ විද්‍යා දත්ත පදනම පවත්වාගෙන යාම සහ භූ විද්‍යා තොරතුරු ජනතාව වෙත ලබා දීමේ වගකීම දරනු ලබන්නේ ද මෙම කාර්යාංශයයි.

ආංශයික කාර්යසාධනය

භූ විද්‍යා සමීක්ෂණ අංශය

භූ විද්‍යා සමීක්ෂණ අංශයේ කාර්ය මණ්ඩලයට පුළුල් අත්දැකීම් සහිත වෘත්තීය භූ විද්‍යාඥයින්, භූ භෞත විද්‍යාඥයින් සහ රසඥයින් ඇතුළත් වන අතර භූ විද්‍යාව ආශ්‍රිත ව්‍යාපෘති සහ සේවා පිලිබඳව කටයුතු කිරීම ඔවුන් විසින් සිදු කරනු ලැබේ. මෙම අංශයේ කටයුතු සඳහා තාක්ෂණ නිලධාරීන්, පර්යේෂණ සහායකයින් සහ සිතියම් නිර්මාණ ශිල්පීන් තම සහාය ලබා දෙයි. මෙහි ප්‍රධාන කටයුතු වන්නේ භූ විද්‍යා, භූ රසායනික සහ චාතුර්යික භූ විද්‍යා සිතියම් සකස් කිරීම සහ ඒවා ප්‍රසිද්ධ කිරීම, භූ කම්පන පිලිබඳ කටයුතු අධීක්ෂණය කිරීම සහ සුනාමි අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සඳහා සහාය ලබා දීමයි.

භූ විද්‍යා සමීක්ෂණ අංශයේ සේවාවන්

ඛණිජ ගවේෂණය, ඉංජිනේරු භූ විද්‍යාව, පාරිසරික භූ විද්‍යාව සහ ඛනිජ ආශ්‍රිත කර්මාන්ත සඳහා විවිධ භූ විද්‍යා උපදේශන සේවා ලබා දීම

විද්‍යාගාර : පාෂාණ, ඛනිජ, පස් පිලිබඳ විශ්ලේෂණ කටයුතු සිදු කිරීම සහ ජලය යොදා ගනිමින් නවීනතම විශ්ලේෂණ කටයුතු සිදු කිරීම විශ්ලේෂණ විද්‍යාගාර විසින් සිදු කරනු ලැබේ. භෞතික ප්‍රකාශිය, විද්‍යුත්, චුම්බක සහ විකිරණශීලී ගුණාංග භාවිතා කරමින් ඛනිජ හා පාෂාණ හඳුනාගැනීම සහ වර්ගීකරණය කිරීම මගින් පාෂාන විද්‍යාත්මක තොරතුරු ලබා දීම පාෂාන විද්‍යා විද්‍යාගාරය මගින් සිදු කෙරෙනු ලැබේ.

භූ භෞතික අංශය : ඛනිජ පවතින ස්ථාන, භූගත ජල සම්පත්, පුරා විද්‍යා ස්ථාන සහ උප පෘෂ්ඨීය තත්ත්වයන් පිලිබඳව පරීක්ෂණ සිදු කිරීම සඳහා විද්‍යුත්, චුම්බක, පොළව විනිවිද යන රේඩාර් සහ භූ කම්පන ශිල්පක්‍රම භාවිතා කරීමේ හැකියාව භූ භෞතික අංශයට ඇත.

විදුම් අංශය : ඛනිජ ගවේෂණය සඳහා සහ භූ තාක්ෂණික පරීක්ෂණ කටයුතු සඳහා විදුම් සේවා ලබා දෙනු ලැබේ. මෙම අංශය සතුව සිදුරු විදුම් උපකරණ හතරක් ඇති අතර ඉන් එකක් කම්බි සහිත විදුම් උපකරණයක් වන අතර එයට මීටර් 500 ක ගැඹුරට ගමන් කළ හැකි අතර ත්‍රිත්ව නාල බට යොදා ගනිමින් ඉතා උස සිදුරු ලබා දීමේ හැකියාව මෙයට ඇත.

භූ කම්පන දත්ත විශ්ලේෂණය සහ සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය ශ්‍රී ලංකාව තුළ හා අවට සිදුවන භූ කම්පන නිරීක්ෂණය කිරීම සහ ඒ පිළිබඳව අනතුරු ඇඟ වීම් නිකුත් කිරීම සඳහා අදාළ ආයතනයන්ට සහාය වීම මෙම මධ්‍යස්ථානයෙහි ප්‍රධාන අරමුණ වේ. පල්ලෙකැලේ (PALK) මහකනදරාව (MALK) සහ හක්මන (HALK) පිහිටි දේශීය භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථාන සහ කලාපය තුළ පිහිටි විදේශීය භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථාන වෙතින් නිසි කලට මෙම මධ්‍යස්ථානය වෙත භූ විද්‍යා තොරතුරු ලැබේ.

ඛනිජ බුද්ධි ඒකකය : ඛනිජ ගවේෂණය සඳහා කාර්යාංශය වෙත ලැබෙන ව්‍යාපෘති යෝජනා ඇගයීමට ලක් කිරීම සහ ඛනිජ ද්‍රව්‍යවලට අගය එකතු කිරීම. ඛනිජ බුද්ධි ඒකකය විසින් ඉටු කරනු ලබන කාර්යයන් වේ. අපනයනය සඳහා පූර්ව අවශ්‍යතාවයන් ලෙස නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා ඛනිජ ආයෝජන ගිවිසුම් පිලියෙල කිරීමද ඛනිජ බුද්ධි ඒකකය විසින් සිදු කරනු ලැබේ.

පුස්තකාලය : භූ විද්‍යාව, කැනීම් කටයුතු සහ ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ පෙළපොත් හා සඟරා මෙන්ම 1903 වර්ෂයේ සිටම සිදු කරන ලද පරීක්ෂණ කටයුතුවල තාක්ෂණික වාර්තාද පුස්තකාලය තුළ අන්තර්ගත වේ. ඒවා නොමිලේ පරිශීලනය කළ හැකි අතර මෑතකදී සිදු කරන ලද පර්යේෂණ විසින් අනාවරණය කරගත් කරුණු භූ විද්‍යා ප්‍රජාව වෙත ලබා දී ඇත.

භූ විද්‍යා සමීක්ෂණ අංශයේ ප්‍රගතිය - 2015

ක්‍රියාකාරී සැලසුම් කටයුතු

සමස්ත ශ්‍රී ලංකාව ආවරණය කරනු ලබන භූ විද්‍යා සිතියම් පළ කිරීම මෙම කාර්යාංශයේ ප්‍රධාන කටයුතු වලින් එකක් වේ. භූමිය පිළිබඳ භූ විද්‍යා තොරතුරු අඩංගු භූ විද්‍යා සිතියම් ඛණිජ හා භූගත ජලය ගවේෂණය කිරීම, ප්‍රධාන ඉදිකිරීම් කටයුතු සහ සිවිල් ඉංජිනේරු කටයුතු සහ නාය යෑම් උවදුරු සිතියම් සකස් කිරීම ආදී කටයුතු රාශියක් සිදු කිරීම සඳහා භාවිතා කරනු ලැබේ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2014 වර්ෂයේදී මුළු දිවයිනම ආවරණය කරනු ලබන (1 : 100,000 පරිමාණයේ) සිතියම් 21 ක මුද්‍රණ කටයුතු නිම කරන ලද අතර දැනටමත් පළ කර ඇති 1 : 100,000 පරිමාණයේ සිතියම් මත පදනම්ව 1 : 250,000 පරිමාණයේ සිතියම් සම්පාදනය කිරීමටද සැලසුම් සකස් කරන ලදී.

ආරම්භයේදී 1: 250,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් 04 ක් මුද්‍රණය කිරීමට අපේක්ෂා කරන ලද අතර එම සිතියම් සම්පාදනය කිරීමේ කටයුතු 2015 වර්ෂයේදී නිම කරන ලද අතර 2016 වර්ෂය ආරම්භයේදී ඒවා පළ කරනු ඇත.

චාතුර්ථික සිතියම් (වෙරළබඩ කලාපය) වැඩසටහන

භූ විද්‍යා කාල පරිමාණයෙහි චාතුර්ථික අවදිය මීට අවුරුදු මිලියන 2කට පෙර කාලයේ සිට වර්තමානය දක්වා ගමන් කරයි. ශ්‍රී ලංකාවේ චාතුර්ථික සැකසීම් තුළට ප්‍රධාන වශයෙන්ම වෙරළබඩ අවසාදිතයන්, ජල ගැලීම් ඇති වන තැන් වල පිහිටි දියළු අවසාදිතයන් සහ පස් සැකසීම් අයත් වේ. කෙසේ වුවද මෙම සැකසීම් තුළ ආර්ථිකමය වශයෙන් වැදගත් මැටි හා වැලි නිධි, කොරල් නිධි, සඹුක පස් ආවරණ සහ භූගත ජල ප්‍රභව ඇතුළත් වන හෙයින් ඒවා අතිශයින්ම වැදගත් වේ. ''චාතුර්ථික භූ විද්‍යා සිතියම් වැඩසටහන'' නම් වූ ව්‍යාපෘතියක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2008 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

මාතර, කළුතර හා අම්බලන්ගොඩ - බලපිටිය කලාපවල 1 : 50,000 පරිමාණයේ චාතුර්ථික සිතියම් සම්පාදන කටයුතු පසුගිය වර්ෂවලදී නිම කරන ලද අතර මෙම සිතියම් 2015 වර්ෂයේ පළමු කාර්තුව තුළදී මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් කැඳවන ලදී. මෙම මිල ගණන් වල ඇගයීම් කටයුතු සිදු කරනු ලබමින් පවතී.

පුත්තලම, කල්පිටිය හම්බන්තොට - තංගල්ල සහ තිස්සමහාරාමය යන කලාපවල සිතියම් සැකසීමේ කටයුතු බොහෝ දුරට නිම කර ඇත. ගාල්ල, යාල, හලාවත, බත්තුළුඔය සහ සිලාවතුර යන කලාපවල ක්ෂේත්‍ර කටයුතු නිම කර ඇති අතර විල්පත්තු කලාපයේ ක්ෂේත්‍ර කටයුතුවලින් 75% සම්පූර්ණ කර ඇත.





1: 50,000 පරිමාණයේ භූ රසායනික සිතියම් වැඩසටහනෙහි සහ චාතුර්ථික සිතියම් වැඩසටහනෙහි ප්‍රගතිය

භූ රසායනික සිතියම් වැඩසටහන

පසෙහි භූ රසායනික ලක්ෂණ අධ්‍යයනය කිරීම සඳහා 2008 වර්ෂයේදී පාංශු භූ රසායනික සිතියම් වැඩසටහන ආරම්භ කරන ලදී. ඛනිජ ගවේෂණය, පාරිසරික අධීක්ෂණ කටයුතු, කෘෂිකාර්මික පර්යේෂණ සහ භූ සෞඛ්‍ය උවදුරු අධ්‍යයනයන් සඳහා මෙම සිතියම් ප්‍රයෝජනවත් වේ. 1 : 50,000 පරිමාණයේ පාදස්ථ සිතියම් මත පදනම්ව භූ රසායනික සිතියම් කටයුතු සිදු කරනු ලබමින් පවතී. එක් වර්ග කිලෝමීටර් 1 ක ප්‍රදේශයකින් පස මතුපිටින් සහ පසෙහි මීටර් 2 ක් ගැඹුරු ප්‍රදේශයකින් පස් නියැදි දෙකක් එකතු කර ගනු ලැබේ. පරමාණුක අවශෝෂක වර්ණාවලිමානය සහ ප්‍රේරිත යුග්ම ප්ලාස්මා ප්‍රකාශ විමෝචන වර්ණාවලිමානය යොදාගෙන රසායනික ලක්ෂණ විශ්ලේෂණය කරනු ලැබේ.

මොරවක, රක්වාන, තිඹොල්කැටිය, හම්බන්තොට මාතර සහ තංගල්ල කලාපවල සිතියම් සම්පාදන කටයුතු පසුගිය වර්ෂ කිහිපය තුළදී සිදු කරන ලද අතර බදුල්ල, අනුරාධපුරය, මැදවච්චිය සහ හොරොව්පතාන කලාපවල විද්‍යාගාර විශ්ලේෂණ කටයුතු සිදු කරන ලදී. පොළොන්නරුව සහ කවුඩුල්ල කලාපවල ක්ෂේත්‍ර කටයුතු 2015 වර්ෂය තුලදී නිම කරන ලද අතර කැකිරාව කලාපයේ ක්ෂේත්‍ර කටයුතු 2016 වර්ෂය දක්වාද දිව යනු ඇත.

වාර්ෂික ඛණිජ ග්‍රන්ථ - 2014 හා 2015

දත්ත ලබාගැනීමේ දුෂ්කරතාවය සහ අදාල නිලධාරීන් වෙනත් කටයුතු වල නිරත වීම නිසා '2014 වාර්ෂික ඛණිජ ග්‍රන්ථය' පිලියෙල කිරීමේ ප්‍රමාදයක් ඇති විය. අවසානයේදී 2014 වාර්ෂික ඛනිජ ග්‍රන්ථය පිළියෙල කරීමේ කටයුතු 2015 වර්ෂයේ මුල් භාගය අවසානයේදී නිම කරන ලද අතර 2015 වාර්ෂික ඛනිජ ග්‍රන්ථය සඳහා දත්ත එකතු කිරීමේ කටයුතු 2015 වර්ෂය තුළදී සිදු කරන ලදි.

පළාත් ඛනිජ ගවේෂණ සහ පළාත් ඛණිජ සිතියම්

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සබරගමුව පලාත තුළ සිදු කිරීමට සැලසුම් කරන ලද ඛනිජ ගවේෂණය වෙනුවට, කර්මාන්ත අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා පිඟන් භාණ්ඩ සභාවේ ඉල්ලීම මත

මධ්‍යම හා ඌව පළාත් තුළ පිඟන් භාණ්ඩ අමුද්‍රව්‍ය සමීක්ෂණයක් සිදු කරන ලදී. සබරගමුව පළාතෙහි ඛනිජ ගවේෂණය 2015 වර්ෂයේ තුන්වන කාර්තුව තුළ අරඹන ලද අතර 2016 වර්ෂය දක්වා එය අඛණ්ඩව සිදු කර ගෙන යන ලදී.

මධ්‍යම හා ඌව පළාත් තුළ ඇති දත්ත යොදා ගනිමින් ඛනිජ සිතියම් සැකසීමේ කටයුතු බොහෝ දුරට අවසන් කර ඇති අතර ඒවා මුද්‍රණය කිරීමට නියමිතව ඇත. උතුරු මැද පළාතේ ඛනිජ සිතියම සැකසීමේ කටයුතු 2015 වර්ෂයේ අවසානය තෙක් අඛණ්ඩව සිදු කරගෙන යන ලදී.

අන්තර්ජාතික පරමාණුක බලශක්ති ආයතනයේ අනුග්‍රහය යටතේ සිදු කරනු ලබන ඛනිජ අමුද්‍රව්‍ය ගවේෂණය සහ අනුබද්ධ කටයුතු

ගැමා විකිරණය මැන බැලීමේ සහ ක්‍රමානුකූල ලෙස නියැදි එකතු කිරීමේ කාර්යය මිටිපොළ ප්‍රදේශය අවිස්සාවේල්ල අවට සහ උතුරු නැගෙනහිර වෙරළ තීරය තුළ 2014 සහ 2015 වර්ෂ වලදී සිදු කරන ලදී. මෙම ක්ෂේත්‍ර කටයුතු නිම කර ඇති අතර මාතලේ, දඹුල්ල, ඇලහැර සහ පල්ලෙගම යන ප්‍රදේශවල ක්ෂේත්‍ර කටයුතු 2015 වර්ෂයේ දෙවන අර්ධය තුළදී අරඹන ලදී. නියැදි විශ්ලේෂණ කටයුතු විද්‍යාගාර තුළ සිදු කරනු ලබමින් පවතින අතර අතුරු වාර්තා ඉදිරිපත් කර ඇත. බඹරකොටුව සහ රත්නපුරය යන ප්‍රදේශවල තෝරියම් සහ යුරේනියම් පවතිනවාද යන්න සොයා බැලීම සඳහා මූලික ක්ෂේත්‍ර සංචාර සිදු කරන ලදී.

ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරියේ අර්ධ පරිත්‍යාගයක් වන කාර් රථයක සිට ක්‍රියාත්මක වන විකිරණ අනාවරණ ඒකකය සහ එක්ස් කිරණ ෆ්ලුවරොසින් වර්ණාවලී මානය 2015 වර්ෂයේදී ලබා දෙන ලදී.

භූ කම්පන දත්ත හා සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානයට සිදු කරන ලද වැඩි දියුණු කිරීම් සහ භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථාන තුන පවත්වාගෙන යාම

සුළු සුළු ගැටලු තිබුණද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ස්ථාපනය කරන ලද භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථාන තුන අනිකුත් ආධාර ලබා දෙන ආයතනවල අනුග්‍රහයද සහිතව මනා ලෙස ක්‍රියාත්මක වෙමින් පවතින අතර මෙම මධ්‍යස්ථානවලින් ලබා ගනු ලබන දත්ත භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ප්‍රධාන කාර්යාලයේ ඇති දත්ත මධ්‍යස්ථානය වෙත සන්නිවේදනය කරනු ලැබේ. 2015 වර්ෂය තුළදී භූ චලන, භූමිය සෙලවීම් සහ ඉන්දියන් සාගරය තුළ සිදු වූ භූමිකම්පා පිළිබඳව මහජනතාව විසින් විමසීම් සිදු කරන ලද අවස්ථාවලදී ඒ සඳහා සාර්ථක ලෙස ප්‍රතිචාර දැක්වීමට මෙම දත්ත මධ්‍යස්ථානයට හැකි විය.

පල්ලෙකැලේ මධ්‍යස්ථානයෙහි තිබූ අඩුපාඩු නිරාකරණය කිරීමේ කටයුතු තුළට පහත සඳහන් කටයුතු අයත් විය. (1) ආධාරක බැටරි පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම (2) අන්තර්ජාතික සංවර්ධන ආධාර යටතේ වූ ව්‍යාපෘතිය සහ විස්තීර්ණ න්‍යෂ්ටික පරීක්ෂණ තහනම් කිරීමේ ගිවිසුම් සංවිධානයෙහි තොරතුරු පද්ධතිය අතර සන්නිවේදන සම්බන්ධතාවය ප්‍රතිසංස්කරණය කර ප්‍රතිස්ථාපනය කිරීම (3) පල්ලෙකැලේ භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථානයෙහි අලාභහානි වී ඇති

අධි විදුලි ධාරා ආරක්ෂක උපකරණ ප්‍රතිස්ථාපනය කිරීම (4) පල්ලෙකැලේ මධ්‍යස්ථානයෙහි ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය නවීකරණ කොට ප්‍රතිස්ථාපනය කිරීම (5) පල්ලෙකැලේ මධ්‍යස්ථානයෙහි අකුණුසැර වැදී හානි වූ 00 සංඛ්‍යාංකය ප්‍රතිස්ථාපනය කිරීම පල්ලෙකැලේ මධ්‍යස්ථානයෙහි ඉතා හොඳ තත්ත්වයේ දකුණු ආරක්ෂණ පද්ධතියක් තිබුනද එය දැඩි ලෙස අකුණුවල බලපෑමට ලක් වේ. මහකනදරාව භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථානයෙහි විදුලි සැපයුම් පද්ධතිය ආශ්‍රිතව ගැටලුවක් පවතින අතර 2016 වර්ෂය මුල් භාගයේදී භූ විද්‍යාවන් පිළිබඳ ජර්මන් පර්යේෂණ ආයතනයෙහි ආධාර ඇතිව එම ගැටලුව විසඳනු ඇත.

අබලන් වූ විදුම් පෙට්ටි සොයා ගැනීම සහ ගබඩා කිරීම

යක්කල පරිශ්‍රය තුළ දිරාගිය ලී පෙට්ටි තුළ ගබඩා කර ඇති පාෂාණ විදුම් පෙට්ටි සොයා ගැනීමට සැලසුම් සකස් කරන ලදී. විදුම් පෙට්ටි අබලන් වූ තත්ත්වයක පැවති අතර නිසි තොරතුරු අනුව ඒවායින් 60% පමණ සොයා ගත හැකි විය. සොයාගන්නා ලද විදුම් පෙට්ටි ගැල්වනයිස් පෙට්ටි 900කට වැඩි සංඛ්‍යාවක 2013, 2014 සහ 2015 වර්ෂවලදී ගබඩා කරන ලදී. 2015 වර්ෂය අවසන් වන විට මෙම ව්‍යාපෘතිය බොහෝ

දුරට නිම කරන ලද අතර එය 2016 වර්ෂයේදී මුල් කාර්තුව වන විට සම්පූර්ණයෙන්ම නිම කිරීමට හැකි වනු ඇත.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පුස්තකාලය නවීකරණය කිරීම

ජාතික ආයතනික සුරක්ෂිතාගාර පද්ධතියෙහි සාමාජිකයෙකු ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි පුස්තකාලය තෝරා ගන්නා ලදී. ජාතික විද්‍යා පදනමෙහි මූල්‍ය අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වන ජාතික අංකිතකරණ ව්‍යාපෘතිය යටතේ මෙම පුස්තකාලයෙහි නවීකරණ කටයුතු සිදු කරනු ලබමින් පවතී. ශාස්ත්‍රීය ග්‍රන්ථ එකතුව අංකිත කිරීම, විද්‍යුත් - සුරක්ෂිතාගාර නිර්මාණය කිරීම, දත්ත පදනම් කලමනාකරණය හා පරිපාලනය පිලිබඳව පුහුණුව ලබා දීම, දැනට පවතින දත්ත පදනම් ඩිඅවකාශය බව පරිවර්තනය කිරීම, උපකරණ හා දත්ත පදනම් ආශ්‍රිත සත්කාරක පහසුකම් ලබා දීම සහ දත්ත ඇතුලත් කිරීම සඳහා තාවකාලික කාර්ය මණ්ඩලය ලබා දීම ජාතික විද්‍යා පදනම මගින් ලබා දෙනු ලබන පහසුකම් තුළට අයත් වේ. අංකිතකරණ කටයුතුවලින් 75% 2015 වර්ෂය තුලදී සම්පූර්ණ කරන ලදී.

පාෂාණ විද්‍යාගාරය

වාණිජ පදනමකින් බාහිර කාර්යයන් සිදු කිරීමට අමතරව ජාතික රත්‍රන් ගවේෂණ කටයුතු සහ ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ආයතනයේ සහාය මත අමුද්‍රව්‍ය ගවේෂණ කටයුතු සම්බන්ධයෙන් ඛනිජ විද්‍යාත්මක විශ්ලේෂණ කටයුතු සිදු කිරීමට විද්‍යාගාරයේ කාර්ය මණ්ඩලය කටයුතු කළේය.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි දෛනික කටයුතු සඳහා 2015 වර්ෂය තුලදී පාෂාණ විද්‍යා විද්‍යාගාරය විසින් ලබා දී ඇති සේවාවන්

- කැළණි ගඟෙහි රත්‍රන් ගවේෂණය - මූලික නියැදි කට්ටල 65 (තෙත් බෑවුම්, චුම්බක හා බර ද්‍රව විභේදනය සම්පූර්ණ කරන ලදී.)
- රේඩියෝ මිතික ගවේෂණය - මූලික නියැදි කට්ටල 64 (විල්ෆ්ලේ චක්‍ර විභේදනය)
- තුනි කඩ පිලියෙල කිරීම - සංඛ්‍යාව 19
- තුනී කඩ පිළියෙල කිරීම - සංඛ්‍යාව 01
- තුනී කඩ පිළියෙල කිරීම - සංඛ්‍යාව 05

මහේස්ත්‍රාත් උසාවි නියැදි

- මහේස්ත්‍රාත් උසාවි නුවර (පෙරහන් විශ්ලේෂණය සහ ඛණිජ විද්‍යා විශ්ලේෂණය)
- මහේස්ත්‍රාත් උසාවි මාළිගාකන්ද (පෙරහන් විශ්ලේෂණය ඛනිජ විද්‍යා විශ්ලේෂණය)
- පොලිස් ස්ථානය - කොච්චිකඩේ (පෙරහන් විශ්ලේෂණය සහ ඛනිජ විද්‍යා විශ්ලේෂණය)
- මහේස්ත්‍රාත් උසාවි - මීගමුව (පෙරහන් විශ්ලේෂණය සහ ඛනිජ විද්‍යා විශ්ලේෂණය)
- මහේස්ත්‍රාත් උසාවි - වාරියපොළ (පෙරහන් විශ්ලේෂණය ඛනිජ විද්‍යා විශ්ලේෂණය)

අනිකුත්

- සඳහිරු සෑය තුනී කඩ - 02
- ශ්‍රී ලංකා රේගුව - 01

විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ පර්යේෂණ ව්‍යාපෘති සඳහා පහසුකම්

- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
  ඩිල්රුක්ෂි මෙනවිය (චුම්බක විභේදනය සහ බ්‍රෝමෝ අවස්ථා විභේදනය)
  සංඛ්‍යාව 25
- අරුණි මෙනවිය (චුම්බක විභේදනය සහ බ්‍රෝමෝ අවස්ථා විභේදනය) සංඛ්‍යාව 15
  ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- රුවන් මහතා - (චුම්බක විභේදනය සහ බ්‍රෝමෝ අවස්ථා විභේදනය)
- GRN ගුණරත්න (චුම්බක විභේදනය සහ බ්‍රෝමෝ අවස්ථා විභේදනය) සංඛ්‍යාව 20

විශ්ලේෂණ විද්‍යාගාරය

බාහිර සේවාදායකයන් සඳහා රසායනික විශ්ලේෂණ කටයුතු සිදු කර දීම

හුණුගල්, තිරුවාන, ඩොලමයිට්, මිනිරන්, හොලඩ්ස්පාර්, පස්, වැලි, සිමෙන්ති, මයිකා, ඛනිජවැලි, මැටි, වතුර, දිරාගිය පාෂාණ සහ අනිකුත් මිශ්‍ර ලෝහ, උළු හා පිඟන් භාණ්ඩ ආදී ද්‍රව්‍ය මිශ්‍රණ ආදිය අඩංගු නියැදි 407 ක විශ්ලේෂණ කටයුතු විවිධ ආයතන හා පුද්ගලයන්ගේ ඉල්ලීම මත මෙම විද්‍යාගාරය විසින් සිදු කරන ලදී.

අභ්‍යන්තර පර්යේෂණ ව්‍යාපෘති සඳහා රසායනික විශ්ලේෂණ කටයුතු

භූ විද්‍යාඥයින් විසින් සිදු කරන ලද විවිධ ගවේෂණ තුලින් ලබා ගන්නා ලද ඉල්මනයිට් නියැදි දෙකක් සහ බෙරිල් නියැදි 10 ක් මෙම විද්‍යාගාරය විසින් විශ්ලේෂණය කරන ලදී.

භූ රසායනික සිතියම් සැකසීම

පහත සඳහන් භූ රසායනික සිතියම් කලාපවලින් ලබා ගන්නා ලද පස් නියැදි පිලියෙල කිරීම, ජීරණය කිරීම සහ විශ්ලේෂණය කිරීම සිදු කරන ලදී.

පර්යේෂණ වැඩසටහන්

තමන් විසින් සිදු කරනු ලබන දෛනික කටයුතුවලට අමතරව භූ විද්‍යා අංශය විසින් පශ්චාත් උපාධි පර්යේෂණ සිදු කරන ශිෂ්‍යයන්ට සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා තම පර්යේෂණ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමද සිදු කරනු ලැබේ.

සේවාදායකයන්ගේ ඉල්ලීම් මත ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා කටයුතු (ආදායම් උත්පාදන)

1 වගුව : 2015 වර්ෂය තුළදී විවිධ ව්‍යාපෘති තුළින් උපයන ලද ආදායමෙහි සාරාංශය

සේවාදායකයා	ව්‍යාපෘතිය	2015 වර්ෂය සඳහා ආදායම එකතු කළ අගය මත බදු / ජාතිය ගොඩනැගීමේ බදු නොමැතිව
පිඟන් භාණ්ඩ සභාව	මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්ක තුළ තිරුවානා නිධි, ෆෙලඩ්ස්පාර්, කෙයොලින්, සහ කැල්සයිඩ් පිහිටි ස්ථාන හඳුනාගැනීම	3,458,527.58
පිඟන් භාණ්ඩ සභාව	බදුල්ල හා මොනරාගල දිස්ත්‍රික්ක තුළ සිදු කරන ලද පිඟන් භාණ්ඩ අමුද්‍රව්‍ය ගවේෂණය කිරීම	
	මා ඔය ඔස්සේ අළුතින් මැටි සහිත ස්ථාන හඳුනාගැනීම	1,412,456.81

සී/ස එම් ආර් එල් ග්‍රෆයිට් සමාගම	අළුකැටිය ප්‍රදේශයෙහි මිනිරන් පිහිටි ස්ථාන සොයා ගැනීම සඳහා විදුම් ගවේෂණ සිදු කිරීම	6,304,530.25
සී/ස ටෝකියෝ සිමෙන්ති සමාගම	අළුකැටිය ප්‍රදේශයෙහි මිනිරන් පිහිටි ස්ථාන සොයා ගැනීම සඳහා විදුම් ගවේෂණ සිදු කිරීම	3,667,107.85
සී/ස ලංකා ඛනිජවැලි සමාගම	බදුල්ල හා මොනරාගල දිස්ත්‍රික්කවල පිඟන් භාණ්ඩ සඳහා අමුද්‍රව්‍ය ඇති ස්ථාන ගවේෂණය කිරීම. මා ඔය ඔසස්සේ මැටි දක්නට ලැබෙන ස්ථාන අළුතින් සොයා ගැනීම	1,825,878.25
සී/ස එම්. ආර්. එල්. ග්‍රැෆයිට් සමාගම	අළුකැටිය ප්‍රදේශයේ මිනිරන් ඇති ස්ථාන අනාවරණය කර ගැනීම සඳහා විදුම් පරීක්ෂණ සිදු කිරීම	12,267,381.70
මහවැලි උපදේශන කාර්යාංශය	උතුරු මැද පළාත් උමං ව්‍යාපෘතිය	
සී/ස එම්. ආර්. එල්. ග්‍රැෆයිට් සමාගම	වරකාපොල ප්‍රදේශයෙහි මිනිරන් පිහිටි ස්ථාන සොයා ගැනීම සඳහා විදුම් ගවේෂණය සිදු කිරීම	3,080,110.00
කාර්මික තාක්ෂණ ආයතනය	චුන්නාකම් බලශක්ති උත්පාදන සංකීර්ණය අවට විදුම් හා නියැදි ව්‍යාපෘතිය	833,371.14
සුනිත්‍ය බලශක්ති අධිකාරිය	බත්තරමුල්ලේ විදුම් වැඩසටහන	543,127.50
පුස්තකාලය		561,118.00
විශ්ලේෂණ විද්‍යාගාරය		2,577,000.00
පාෂාණ විද්‍යා විද්‍යාගාරය		872,210.00

අනිකුත් කටයුතු

- **දින 100 වැඩසටහන : සමස්ත දිවයින ආවරණය කරනු ලබන කඩිනම් ඛනිජ වැලි ගවේෂණය**

2015 වර්ෂය මුල් භාගයේදී සෑම කණ්ඩායමක්ම භූ විද්‍යාඥයෙකුගේ මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන කණ්ඩායම් 9 ක් විසින් සමස්ත දිවයිනම ආවරණය වන පරිදි පළාත් මට්ටමේ ඛනිජවැලි ගවේෂණයන් සිදු කරන ලදී. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත මෙහි අවසන් වාර්තා භාර දෙනු ලැබුණි.

- **දින100 වැඩ සටහන : උතුරු මැද පළාතේ ආසනික් පර්යේෂන වැඩසටහන**

අනුරාධපුරය හා පොලොන්නරුව යන දිස්ත්‍රික්ක වල ජලය, පස්, පාෂාණ සහ කුඹුරු ආශ්‍රිතව ලබාගන්නා ලද නියැදි වල ආසනික් සහ අනිකුත් බර ලෝහ අන්තර්ගතවේද යන්න නිරීක්ෂණ කිරීම සඳහා ඒවා සකසා විශ්ලේෂණය කරන ලදී.

- **ස්ථානීය පරීක්ෂා කිරීම් සංවිධානය කිරීම පිලිබඳ කලාපීය හඳුන්වාදීමේ වැඩසටහන**

ස්ථානීය පරීක්ෂා කිරීමක් යනු විස්තීරණ න්‍යෂ්ඨික පරීක්ෂණ තහනම් කිරීමේ ගිවිසුම් සංවිධානයේ නියමයන් හා අනුකූලව කටයුතු කරන්නේද යන්න සනාථ කරගැනිම සඳහා සිදු කරනු ලබන අවසාන තහවුරු කිරීමේ ක්‍රියා පිළිවෙතයි. ස්ථානීය පරීක්ෂා කිරීමක් ඕනෑම සමාජීය රාජ්‍යයක් විසින් ඉල්ලා සිටීමට හැකි අතර ඉහත කී ගිවිසුම බලාත්මක වූ පසු මෙය සිදු කළ හැකි වනු ඇත.

2015 නොවැම්බර් මස 29 වන දින සිට දෙසැම්බර් මස 05 වැනි දින දක්වා කලින් කල බදුල්ලේදී පැවැත්වුණු ස්ථානීය පරීක්ෂා කිරීම් පිලිබඳ කලාපිය හඳුන්වාදීමේ වැඩසටහන් සඳහා සත්කාරකත්වය ශ්‍රී ලංකාව දැරීය. ශ්‍රී ලංකාවේ මීට අදාල ප්‍රධාන තාක්ෂණික කේන්ද්‍රීය ආයතනය ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මෙම වැඩසටහනට සහභාගි විය. ස්ථානීය පරීක්ෂා කිරීම් පිලිබඳ සංකල්ප, තාක්ෂණයන් සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් වන පුළුල්

ක්ෂේත්‍රය පිළිබඳ විද්වතුන් දැනුවත් කිරීම මෙම පාඨමාලාවේ අරමුණ විය. ඉරානය, ඉරාකය, ඊශ්‍රායලය, ජෝර්දානය, කසකස්තානය, කිර්ගිස්තානය, මාලදිවයින, ඕමානය, කටාර්, දකුණු අප්‍රිකාව සහ ශ්‍රී ලංකාව යන රටවල් 13ක විද්වතුන් 50කට අධික සංඛ්‍යාවක් මෙයට සහභාගි විය. විද්‍යුත් ඉගෙනුම් මොඩියුල කෙටි දේශන, ප්‍රායෝගික පුහුණු සැසි සහ උපකරණ ආදර්ශනයන්, කණ්ඩායම් ක්‍රියාකාරකම් සහ ක්ෂේත්‍ර අභ්‍යාස ඔස්සේ අන්තර් ක්‍රියාකාරී ක්‍රමවේදයන් අනුගමනය කිරීමත් ස්ථානීය පරීක්ෂා කිරීම් ක්‍රම පිළිබඳව ඉගෙනීමට මෙම වැඩමුළුවේදී අවස්ථාව ලැබුණි.

- **මා ඔය සඳහා කළමනාකරණ සැලැස්ම පිලියෙල කිරීම**

ක්ෂේත්‍ර පර්යේෂණ සිදු කරමින් සහ පස් අවුරුදු කළමනාකරණ සැලැස්ම' පිළිබඳව අදහස ලබා දෙමින් කළමනාකරණ සැලැස්ම පිලියෙල කිරීම සඳහා භූ විද්‍යා අංශයේ භූ විද්‍යාඥයින් සම්බන්ධ විය.

- **ගිං ගඟෙහි වැලි ගවේෂණය :**

ගිං ගඟ ප්‍රදේශයෙහි ඛනිජ වැලි සම්පත් කැනිය හැකි සහ පාරිසරික ලෙස හානියට ලක් නොවූ ප්‍රදේශ ආවරණය කර ගැනීම සඳහා ඛනිජ වැලි ගවේෂණයන් සිදු කරන ලදී. 2015 දෙසැම්බර් 16 දින සිට 2016 ජනවාරි 01 වැනි දින දක්වා මෙම ගවේෂණය සිදු කරන ලදි.

- **උමා ඔය ව්‍යාපෘතිය**

උමා ඔය ව්‍යාපෘතිය සඳහා උපදෙස් ලබා දීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් පත් කරන ලද විද්වත් මණ්ඩලයෙහි කමිටු සාමපිකයන් ලෙස කටයුතු කරන ලදී. විද්වත් මණ්ඩලයේ සාමාජිකයන් සමඟ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකරන ලද අතර ව්‍යාපෘතියෙහි කළමනාකරණය පිලිබඳ සවිස්තර වාර්තාවක් අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී.

- **භූ විද්‍යා ගවේෂණ**

  - ✓ හබරන - මොරගහකන්ද උමං මාර්ගය ඔස්සේ භූ භෞතික ගවේෂණය
  - ✓ තිරුක්කෝවිල් භූ භෞතික ගවේෂණය අධීක්ෂක මට්ටමේ පවති
  - ✓ ඩොලරයිට් නිධි අනාවරණය කර ගැනීම සඳහා පදියතලාව ප්‍රදේශයේ සිදු කළ භූ භෞතික ගවේෂණ (චුම්බක ගවේෂණ)
  - ✓ ඩොලරයිට් අනාවරණය කර ගැනීම සඳහා පදියතලාව ප්‍රදේශයේ සිදු කරන ලද භූ භෞතික ගවේෂණය
  - ✓ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය හා සමග එක්ව මඩකලපුව ප්‍රදේශයේ සිදු කළ භූ භෞතික පරීක්ෂණය
  - ✓ ත්‍රිකුණාමලය, උප්පුවේලි සහ නිලාවැලි පොලිස් කොට්ඨාශ තුළ සිදු කළ භූ-භෞතික පරික්ෂණය
  - ✓ ගම්පහ, වැලිකඩ, පුත්තලම, මැදවච්චිය, එප්පාවෙල සහ අම්බලන්ගොඩ ප්‍රදේශවල කළුගල් ගවේෂණය
  - ✓ කච්චතිවු, කයිට්ස්, ඩෙල්ෆ්ට් දූපත්වල භූ - භෞතික ගවේෂණය

ක්ෂේත්‍ර පරික්ෂණ හා අනිකුත් කෙටිකාලීන කටයුතු

- 2015 මැයි මස 15 වැනි දින ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් කොළඹ වරායේ රඳවා ගන්නා ලද කවුලුන් සමාගම විසින් අපනයනය කිරීමට නියමිතව තිබූ තිරුවානා තොගය පරීක්ෂා කිරීම මෙහි සවිස්තර වාර්තාව ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලදී.

රේගුව තුළ සිදු කරන ලද පරීක්ෂණ වාර්තාව මත පදනම්ව සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහ සභාපතිවරයාගේ ඉල්ලීම මත දිවුලපිටියේ පිහිටි කවුලුන් කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ඒකාබද්ධ කර්මාන්තශාලා පරීක්ෂණ චාරිකාවක් සිදු කරන ලදී. (2015.05.18)

- මාදම්පේ ප්‍රදේශයේ පිහිටි තරන වත්තෙහි වැලි අධි භාවිතය පිලිබඳව සිදු කරන ලද විමර්ශනය මත පදනම්ව කැනීම් අංශය හා එක්ව ඒකාබද්ධ ක්ෂේත්‍ර ගවේෂණයක් සිදු කරන ලදී. (2015/08/04)
- තලාව පිහිටි ඉන්ඩස්ට්‍රියල් මිනරල් එක්ස්පෝට් සමාගමට අයත් අපනයනය සඳහා ප්‍රතික්ෂේප කරන ලද මයිකා තොගයක් ඔවුන් විසින් ප්‍රකාශ කරන ලද මිල ප්‍රකාරව නැවත අපනයනය කිරීම සඳහා සුදුසුද යන්න පරීක්ෂා කිරීම සඳහා කර්මාන්ත ශාලාව තුළ පරීක්ෂණ චාරිකාවන් සිදු කරන ලදී. මෙය ප්‍රධාන කාර්යාලයෙහි කැනීම් ඉංජිනේරුවරයෙකු හා එක්ව සිදු කරන ලදී.
- මීගොඩ ප්‍රදේශයේ නිවසකට යාබදව උමගක් තුළට භූගත ජලය ගලා යාම පිළිබඳව ලැබුණු පැමිණිල්ලක් විමර්ශනය කිරීම
- ඇහැලියගොඩ රුක්මල්දෙනියවත්ත ප්‍රදේශයේ පිහිටි සී/ස 'වියර් බිරූවර්' පුද්ගලික සමාගම විසින් ගල් වැඩපලක් ආරම්භ කිරීමට යෝජිත ඉඩම පරීක්ෂා කිරීම
- වීරකැටිය නයිගල රජමහා විහාරයේ රැඳවුම් බැම්මෙහි අඩිතාලමෙහි දෝෂය පරීක්ෂා කිරීම (වාර්තාව ඉදිරිපත් කරන ලදී)
- හෝමාගම දිසා අධිකරණයෙහි ඉල්ලීම මත හෝමාගම පිටිපන උතුර ප්‍රදේශයෙහි නීතිවිරෝධී පස් කැනීම් පරීක්ෂා කිරීම (ඒකාබද්ධ වාර්තාව ඉදිරිපත් කරන ලදී)
- සනි ක්‍රියේෂන්ස් ඉන්ටර්නැෂනල් සමාගම විසින් ඉදිරිපත් කන ලද ඛනිජ ආයෝජන ගිවිසුම් වාර්තාව ඇගයීම
- ශ්‍රී ලංකාව තුළ ඛනිජ තෙල් නිධි දක්නට ලැබීම සම්බන්ධයෙන් වි. එම්. රත්නායක මහතාගේ ඉල්ලීම මත සභාපතිවරයා වෙත කෙටි භූ විද්‍යා වාර්තාවක් ඉදිරිපත් කරන ලදි.
- එඬේරමුල්ලේ සිරි සුමනාරාමය නම් විහාරයෙහි බෑවුම තුළ ඇති දෝෂයක් පරීක්ෂා කිරීම සඳහා 2015/06/01 දින කෙටි ක්ෂේත්‍ර සංචාරයක් සිදු කරන ලදි.

යන මැයින් වු වාර්තාව 2015.06.04 දින ඉදිරිපත් කරන ලදී.

ප්‍රදර්ශනය / සම්මන්ත්‍රණ / දැනුවත් කිරීමේ වැඩසටහන්

- භූ චලන, එලක, භූමිකම්පා සහ සුනාමි පිළිබඳව පින්නවල මාධ්‍ය මහා විද්‍යාලයේ සිසුන් හට පෙබරවාරි මස 26 දින දේශනයක් පවත්වන ලදී.
- ඔක්තෝබර් මස 22 වැනි දින දේවි බාලික විද්‍යාලයේ ශිෂ්‍යාවන් හට ස්වාභාවික ව්‍යසන පිළිබඳ භූ විද්‍යාත්මක පිරික්සුම යන මැයින් වූ දේශනයක් පවත්වන ලදී.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදි ගුරුවරුන් සඳහා සංවිධානය කරන ලද දේශනයන් පැවැත්වීම
- ජුනි මස 05 - 06 දින මැදිරිගිරියේදී පවත්වන ලද ලෝක පරිසර දින ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කිරීමට කටයුතු සම්පාදනය කිරීම සහ ඒ සඳහා සහභාගි වීම
- භූ විද්‍යා සමික්ෂණ හා පතල් කාර්යාංශය සහ ශ්‍රී ලංකා භූ විද්‍යා සංගමය විසින් 2015 ජුලි මස 02 සහ 03 දින වලදි ඇඹිලිපිටිය මධ්‍ය විද්‍යාලයේදී සංවිධානය කරන ලද පාසල් විද්‍යා වැඩසටහනට සහභාගි වීම

- කොළඹ දේවි බාලිකා විදුහලෙහි උසස් පෙළ සිසුන් සඳහා පාසල් විද්‍යා වැඩසටහනක් සංවිධානය කිරීම

- පොලීසි, ආරක්ෂක හමුදා, රජයේ නිලධාරීන්, පාසල් දරුවන් සහ ග්‍රාමීය ප්‍රජාව ඇතුළු විවිධ පිරිස් හට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී දේශන පැවැත්වීම

ප්‍රදර්ශන

- ධර්මපාල විද්‍යාලය - පන්නිපිටිය
- තක්ෂිලා කනිෂ්ඨ විද්‍යාලය - හොරණ
- කෝට්ටේ විද්‍යාලය - රාජගිරිය
- රෙජී රණතුංග විද්‍යාලය - මිනුවන්ගොඩ
- සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ (සහභාගි වීම)
- සිද්ධාර්ථ මහා විද්‍යාලය
- අළුත්ගම මහා විද්‍යාලය - අළුත්ගම
- සුමංගල බාලිකා මහා විද්‍යාලය - පානදුර (සහභාගි වීම)
- මැණික් හා ස්වර්ණාභාරණ ප්‍රදර්ශනය - බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව (ස්වර්ණ - 2015) (සහභාගි වීම)

පර්යේෂණ ප්‍රකාශන

- ශ්‍රී ලංකාවේ දකුණු ගිනිකොණ දිග උස්බිම් සංකීර්ණය වෙතින් ලබාගත් කළුගල් කැටිති සහ කැල්සියම් සිලිකේට් කැටිති වල පාෂාණ විද්‍යාව පිළිබඳප පර්යේෂණ නිබන්ධනයබ ඒවායේ ඇගයීමෙහි භෞතික රසායනික තත්ත්වයන් මත වැඩිදුර සීමාකාරී සාදක ශ්‍රී ලංකා භූ විද්‍යා සංගමයෙහි සඟරාව පී පී කුරේ අනුස්මරණ කලාපය

දේශීය හා ජාත්‍යන්තර වැඩසටහන් සඳහා සහභාගි වීම

නිලධාරියාගේ නම	වැඩසටහන	ස්ථානය	කාලපරිච්ඡේදය
ඩී. ටී. ඩබ්ලිව්. එස්. විජේසුන්දර මිය	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද ජල ගැලීම් ආරක්ෂණ ආඥා පනත සංශෝධනය කිරීම සඳහා අදාල පාර්ශ්වකරුවව් උදෙසා වූ උපදේශ වැඩමුළුව	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	19/02/2015
	බලපත්‍ර ලබා දීමේ ක්‍රියා පටිපාටි තුලදී අනුගමනය කළ යුතු නීතිමය පැතිකඩ පිලිබඳව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි නිලධාරීන් දැනුවත් කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි නීති අංශය විසින් සංවිධානය කරන ලද වැඩමුළුව	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	21/03/2015
	විස්තීර්ණ න්‍යෂ්ඨික පර්යේෂණ තහනම් කිරීමේ ගිවිසුම් සංවිධානය විසින් සංවිධානය කරන ලද විශේෂඥ හමුව	වියානා, ඔස්ට්‍රියාව	17/10/2015 - 24/10/2015

	ව්‍යාපාර කළමනාකරණය පිලිබඳ ජාතික ආයතනය විසින් සංවිධානය කරන ලද ලිපිගොනු කළමනාකරණය, පරිපාලන නිති, මූල්‍ය රෙගුලාසි සහ කාර්යාල කළමනාකරණය පිලිබඳ වැඩමුළුව	ව්‍යාපාර කළමනාකරණය පිලිබඳ ජාතික ආයතනය, කොළඹ 7	18/12/2015 - 19/12/2015
ඒ. ඩී. පී. ප්‍රියන්ත මහතා	'දියුණුවෙමින් පවතින රටවල් සඳහා වූ භූ රසායනික සිතියම් සැකසීම හා පාරිසරික භූ රසායන තාක්ෂණයන් පිලිබඳ පුහුණු වැඩසටහන - 2015' සඳහා සහභාගි වීම චීන භූ විද්‍යා සමීක්ෂණ ආයතනයේ සංස්ථා පර්යේෂණ මධ්‍යස්ථානය විසින් මෙය සංවිධානය කරන ලදී.	චීනය	
	වෙරළ සංරක්සණ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද දේශගුණික අවදානම් තත්ත්ව අඩු කිරීම පිලිබඳ වෙරළ ඉංජිනේරු විද්‍යාව යන මැයෙන් වූ එක් දින වැඩමුළුවට සහභාගි වීම		
පී. එන්. අමරසූරිය මෙනවිය	පුස්තකාලයේ සේවයේ නිරත වෘත්තිකයන් සඳහා තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය පිලිබඳ වැඩමුළුව		22/01/2015
	ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේදී පුස්තකාලයාධිපතින් සඳහා පවච්චන ලද පර්යේෂණ ක්‍රමවේදයන් පිලිබඳ වැඩමුළුව		14/01/2015
	ජාතික විද්‍යා පදනමෙහි පවත්වන ලද ශ්‍රී ලංකාවේ පුස්තකාල තුළ භාවිතා කරනු ලබන පුස්තකාල කළමනාකරණ මෘදුකාංගය පිලිබඳ සමාලෝචන සම්මන්ත්‍රණය (ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ ජාලය)		30/01/2015
	2015/05/27 දින ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනයෙහි ශ්‍රවණාගාරය තුළදී පවත්වන ලද පුස්තකාල මෘදුකාංගය පිලිබඳ නව ප්‍රවණතා යන මැයින් වූ වැඩමුළුව		
	2015/05/29 දින ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේදී පවත්වන ලද ජාතික සංගම් නාමාවලිය පිලිබඳ වැඩමුළුව		
	ග්ලෝබල් ටවර් හෝටලයේදී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් සංවිධානය කර පවත්වන ලද දකුණු ආසියාවේ පුස්තකාල අතර සහයෝගිතාවය ශක්තිමත් කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය		3/8/2015
	ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේදී පවත්වන ලද ඩුවේ දශම වර්ගීකරණය පිලිබඳ ප්‍රායෝගික හා න්‍යායික වැඩමුළුව		6/8/2015
	ජාතික විද්‍යා පදනමේදී පවත්වන ලදස පුස්තකාල අංකිතකරණ සමාලෝචනය		11/8/2015

	2015/09/25 දින ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ශ්‍රවණාගාරයේදී පවත්වන ලද පුස්තකාල කළමනාකරණය පිලිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය		22/09/2015
	ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේදී පවත්වන ලද ප්‍රායෝගික නාමාවලිකරණය පිලිබඳ වැඩමුළුව		26/09/2015
ඩී. වී. ආර්. වීරකෝන් මිය	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේදසි සහ කළුතර සිට අම්බලන්ගොඩ දක්වා වූ ප්‍රදේශය අවටදී පවත්වන ලද ඛනිජවල විකිරණ අනාවරණය කර ගැනීම සඳහා වූ මොනා ක්‍රමවේදය පිලිබඳ තුන් දින ප්‍රාදේශිය පුහුණුව	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	17/05/2015 to 19/05/2015
	'ආර්ථික ඛනිජ සහ ශ්‍රී ලංකාවේ ඛනිජ සඳහා අගය එකතු කිරීම' පිලිබඳව කළමනාකරුවන් සඳහා පවත්වන ලද එක් දින වැඩමුළුව	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	7/7/2015
	භූ විද්‍යා හා ඛනිජ සම්පත් පිලිබඳ කොරියන් ආයතනය (මීට කලින් කොරියන් භූ විද්‍යා සමීක්ෂණ ආයතනය) විසින් සංවිධානය කරන ලද' වෙරළ භූවිද්‍යාව සහ භූ උවදුරු' යන මැයෙන් වූ විධිමත් පුහුණු පාඨමාලාව හා සම්මන්ත්‍රණය	දකුණු කොරියාව	5/10/2015 to 21/10/2015
	වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද වෙරළබඩ හා වෙරළ අවට පරිසරය තුළ ඉදිකිරීම් සඳහා ආරක්ෂණ පියවර පිලිබඳ එක්දින වැඩමුළුව	වෝටර්ස් එජ් හෝටලය	04/11/2015
එල්. එම්. ටී. එස්. බී. මුණසිංහ මහතා	විස්තරණ න්‍යෂ්ටික පර්යේෂණ තහනම් කිරීමේ ගිවිසුම් සංවිධානය විසින් පවත්වන ලද ස්ථානීය පරීක්ෂා කිරීම් පිලිබඳ කලාපීය හඳුන්වාදීමේ වැඩමුළුව	කණ්ඩලම, දඹුල්ල	29/11/2015 to 06/12/2015
ඒ. එම්. ඩී. යූ. අබේසිංහ මහතා	විස්තරණ න්‍යෂ්ටික පර්යේෂණ තහනම් කිරීමේ ගිවිසුම් සංවිධානය විසින් පවත්වන ලද ස්ථානීය පරීක්ෂා කිරීම් පිලිබඳ කලාපීය හඳුන්වාදීමේ වැඩමුළුව	කණ්ඩලම, දඹුල්ල	29/11/2015 to 06/12/2015
ජේ. එම්. ජේ. පී. අජිත්ප්‍රේම මහතා	ජපන් අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතනය විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේදි පවත්වන ලද දුරස්ථ සංවේදී වැඩමුළුව		21/01/2015
	ව්‍යාපාර කළමනාකරණය පිලිබඳ ජාතික ආයතනය විසින් සංවිධානය කරන ලද ලිපිගෙ ානු කළමනාකරණය, පරිපාලන නීති සහ කාර්යාල කළමනාකරණය පිලිබඳ වැඩමුළුව	ව්‍යාපාර කළමනාකරණය පිලිබඳ ජාතික ආයතනය, කොළඹ 7	18/12/2015 to 19/12/2015

වයි. පී. එස්. සිරිවර්ධන මහත්මිය	අන්තර්ජාතික පරමාණුක බලශක්ති අධිකාරිය, න්‍යෂ්ඨික විද්‍යා හා යෙදවුම් දෙපාර්තමේන්තුව, සයිබර්ටෝෆ් විද්‍යාගාර, භූ පරිසර විද්‍යාගාරය තුළදී පවත්වන ලද පුහුණු වැඩසටහනට සහභාගිවීම	වියානා, ඕස්ට්‍රියාව	1/09/2015 to 30/10/2015
එස්. එස්. බී. තල්දෙන	IRIS/IDA විසින් ඒකාබද්ධ ලෙස සංවිධානය කරන ලද සහායක භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථාන ක්‍රියාකරුවන් සඳහා වූ තාක්ෂණික වැඩමුළුව	වියානා, ඕස්ට්‍රියාව	12/10/2015 to 16/10/2015
	අන්තර්ජාතික අධීක්ෂණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම පිලිබඳ 5 වන වැඩමුළුව	වියානා, ඕස්ට්‍රියාව	05/10/2015 to 09/10/2016
	ව්‍යාපාර කළමනාකරණ පිලිබඳ ජාතික ආයතනය විසින් සංවිධානය කරන ලද ලිපිගොනු කළමනාකරණය, පරිපාලන නීති මූල්‍ය රෙගුලාසි හා කාර්යාල කළමනාකරණය පිලිබඳ වැඩමුළුව	ව්‍යාපාර කළමනාකරණය පිලිබඳ ජාතික ආයතනය, කොළඹ 7	18/12/2015 to 19/12/2015
	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහිදි සහ කලුතර සිට අම්බලන්ගොඩ දක්වා වූ ප්‍රදේශය අවට පවත්වන ලද ඛනිජ තුළ විකිරණ අනාවරණය කර ගැනීම සඳහා වූ මොනා ක්‍රමවේදය පිලිබඳ තුන් දින දේශීය පුහුණු වැඩසටහන	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	17/05/2015 to 19/05/2015

කැනීම් අංශය

කැනීම් අංශයෙහි ප්‍රධාන කටයුතු

කැනීම් අංශය වර්තමානයේදී ප්‍රාදේශීය කාර්යාල 154කින් සමන්විතව ක්‍රියාත්මක වේ. විවිධ කැනීම් කර්මාන්තවල නිරත සේවාදායකයන් හට අපගේ සේවාවන් ලබා දීම සඳහා මෙම කාර්යාල පිහිටුවා ඇත. 1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනතට ගෙනෙන ලද මෑතකාලීන සංශෝධන ප්‍රාකරව නීති විරෝධී කැනීම් කටයුතු නතර කිරීම සඳහා කාර්යාංශය වෙත පුළුල් බලතල ලබා දී ඇත. මෙහි ප්‍රධාන කටයුතු තුලට ස්ථානීය පරීක්ෂාවන් සිදු කිරීම, පරීක්ෂණ පිපිරුම් සිදු කිරීම, මහජන පැමිණිලි විමර්ශනය කිරීම, ඛනිජ කැනීම්, වෙළඳාම, ගවේෂණය හා ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ නීති විරෝධී කැනීම් කටයුතු අවම කිරීම ඇතුළත් වේ. කැනීම් අංශයේ ප්‍රධාන කටයුතු පහත සඳහන් වේ.

- ❖ 1992 අංක 33 දරන පනත යටතේ ඛනිජ සැකසීම හා අපනයනය සඳහා කැනීම් කටයුතුවල වාණිජමය ශක්‍යතාවය ඇගයීම

- ❖ ඛනිජ ගවේෂණය හා කැනීම් කටයුතු සහ එම ඛනිජ සැකසීම, වෙළඳාම හා අපනයනය බලපත්‍ර ලබා දීම තුලින් නියාමනය කිරීම

- ❖ වාණිජමය පදනමකින් ඛනිජ නිස්සාරණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමෝපායන් පිලිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම

ලබා දෙන ලද සේවාවන්

- ❖ පතල් පරීක්ෂා කිරීම (ජංගම සේවය - බලපත්‍ර නිකුත් කිරීම තාක්ෂණික සේවා)

- ❖ විශේෂඥ සේවාවන් (පිපිරවීම් ශිල්පීය ක්‍රම, බලපත්‍ර නවීකරණය කිරීම, ආරක්ෂණ ක්‍රම, පරීක්ෂණ පිපිරවීම්, පොළව ඉරි තැලීම් පරීක්ෂාව)

- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන් (රජයේ නිලධාරීන් හා බලපත්‍රලාභීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, කැනීම් කටයුතු සහ ප්‍රදර්ශන වල නිරත පුද්ගලයන් සඳහා වැඩමුළු, ප්‍රදර්ශන)

- ❖ පුනරුත්ථාපන වැඩසටහන් (පරිසරය ආරක්ෂා කිරීම සඳහා පතල්කරුවන් දිරිගැන්වීම සහ පතල්කරුවන් විසින් ක්‍රියාත්මක කරනු ලබන පරිසර ආරක්ෂණ හා පුනරුත්ථාපන කටයුතු අධීක්ෂණය කිරීම)

බලපත්‍ර නිකුත් කිරීම තුලින් ආදායම උපයා ගැනීම

1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත යටතේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පහත සඳහන් බලපත්‍ර වර්ග නිකුත් කරනු ලැබේ.

- ■ ගවේෂණ බලපත්‍ර
- ■ කැනීම් බලපත්‍ර (ශිල්පීය, කාර්මික, විශේෂිත ඛනිජ)
- ■ වෙළඳ බලපත්‍ර
- ■ ප්‍රවාහන බලපත්‍ර

මෙම බලපත්‍රවල තොරතුරු පහත දැක්වේ.

■ **ගවේෂණ බලපත්‍ර**

බලපත්‍රය මගින් අවසර ලබා දෙනු ලබන සියළුම කාණ්ඩවලට අයත් ඛනිජ ගවේසණය කිරීම සඳහා විශේෂිත අයිතිය බලපත්‍රලාභියා හට ගවේෂණ බලපත්‍රයක් මගින් ලබා දෙනු ලැබේ.

■ **කැනීම් බලපත්‍ර**

ශිල්පීය කැනීම් බලපත්‍ර

හෙක්ටෙයාර් දහයක් නොඉක්මවන ප්‍රදේශයක් තුල හෝ මීටර් 25 ඉක්මවා නොයන ගැඹුරක් දක්වා බලපත්‍රය තුළ නිශ්චිතව දක්වා ඇති සියලුම ඛනිජ කැනීම, සැකසීම හා වෙළඳාම් කිරීම සඳහා විශේෂිත බලය බලපත්‍රලාභියාට ලබා දෙනු ලැබේ.

අ කාණ්ඩය - පහත සඳහන් කොන්දේසි එකක් හෝ කිහිපයක් අන්තර්ගත වේ.

- සිදුරේ ගැඹුරු මීටර් 1.5 ට වඩා අඩු විය යුතුය
- මාසික නිෂ්පාදන ධාරිතාවය ඝන මීටර් 100 ට වඩා නොඅඩු විය යුතු අතර ඝන මීටර් 600 ට වඩා නොවැඩි විය යුතුය
- යන්ත්‍රෝපකරණ භාවිතා නොකළ යුතු වේ

ආ කාණ්ඩය - පහත සඳහන් කොන්දේසි එකක් හෝ කිහිපයක් අන්තර්ගත වේ.

- සිදුරේ ගැඹුර මීටර් 1.5 ට වඩා අඩු විය යුතුය
- මාසික නිෂ්පාදන ධාරිතාවය ඝන මීටර් 100 නොඉක්මවිය යුතුය
- යන්ත්‍රෝපකරණ භාවිතා නොකළ යුතු වේ

කාර්මික කැනීම් බලපත්‍ර

බලපත්‍රය තුළ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශය තුළ කනින ලද සියලුම ඛනිජ කැනීම, සැකසීම සහ වෙළඳාම, ගවේෂණය සඳහා විශේෂිත බලය මෙම බලපත්‍රය මගින් ලබා දෙනු ලැබේ.

අ කාණ්ඩය : (පහත සඳහන් කොන්දේසි එකක් හෝ කිහිපයක් අඩංගු වේ)

- පිපිරවීම් ක්‍රමය - ප්‍රමාද කිරීමේ මූලද්‍රව්‍ය භාවිතා කරන බහු සිදුරු ක්‍රමය
- සිදුරේ ගැඹුරු මීටර් 3 ට වඩා වැඩි විය යුතුය
- නිෂ්පාදන ධාරිතාවය - මාසයකට ඝන මීටර් 15600 ට වඩා වැඩි විය යුතුය
- භාවිතා කළ හැකි යන්ත්‍රෝපකරණ - මාර්ග විදුම් උපකරණ, ජැක්කු මිටි, ගල් කඩන යන්ත්‍ර, ඉදිරි කොන් පැටවුම් යන්ත්‍ර සහ අනෙකුත් යන්ත්‍රෝපකරණ

නිවාස ණය පොළී අයකරගැනීම්	4,470,006.88	3,447,150.75

මෝටර් වාහන - අළුත්වැඩියා	4,639,002.68	5,586,864.78
මෝටර් වාහන - සේවා ගාස්තු	2,764,388.24	2,673,556.94
මෝටර් වාහන - කුලී ගාස්තු	48,882.00	86,877.00
මෝටර් වාහන - වෙනත්	837,298.49	816,838.49
රක්ෂණ - පුද්ගල හදිසි අනතුරු	512,312.51	626,433.82
රක්ෂණ - වෙනත්	2,011,950.19	1,315,296.49
රක්ෂණ - H&S	3,214,183.70	2,663,233.29
රක්ෂණ - මෝටර් වාහන	4,530,862.79	4,027,522.58
රක්ෂණ - ගොඩනැගිලි	325,006.58	319,294.05
නඩත්තුව -ගොඩනැගිලි	2,701,822.15	2,255,225.72
නඩත්තුව - පිරියත හා උපකරණ	147,530.00	378,700.04
නඩත්තුව - විදුලි සෝපාන	232,981.52	60,180.31
නඩත්තුව - කාර්යාලයීය උපකරණ	2,642,636.45	3,388,606.67
නඩත්තුව - මෘදුකාංග	772,403.54	618,586.07
නඩත්තුව - විදුලි උත්පාදක යන්ත්‍ර	269,512.08	405,389.51
අධ්‍යක්ෂ මණ්ඩල වියදම්	310,682.20	556,331.50
නීති ගාස්තු	299,350.00	667,997.00
විගණන ගාස්තු	1,512,843.70	960,455.00
බැංකු ගාස්තු	13,705.84	51,397.99
තැපැල් ගාස්තු	660,882.00	609,015.00
මුද්දර ගාස්තු	190,475.00	179,825.00
ලිපි ද්‍රව්‍ය	3,215,181.58	2,057,667.67
වෙළඳ දැන්වීම්	2,051,753.75	1,577,466.35
වෙළඳ ප්‍රවර්ධන කටයුතු	200,000.00	429,498.78
අවප්‍රමාණයන්	106,408,827.96	94,218,703.55
V.A.T/N.B.T/E.S.C	7,077,027.07	27,029,015.18
පරිත්‍යාග	750,900.00	3,013,631.41
පුනරුත්ථාපන	73,000.00	671,988.00
සෙසු වියදම් - සටහන 20 (අ)	12,095,582.81	18,862,402.82
	372,653,632.52	419,473,253.76

සටහන20 (අ) සෙසු වියදම්

	2015	2014
	එකතුව රු.	**එකතුව රු.**
සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය	6,000.00	43,500.00
දැයට කිරුළ		1,921,824.17
පාරිසරික දිනය/ CSR	1,172,633.51	5,140,268.01
වාහන සොයා ගැනීමේ පද්ධත		329,152.33
මහ නගර සභා බදු	591,855.60	591,855.60
ටෙන්ඩර් මණ්ඩලය	110,300.00	112,300.00
යක්කල බදු වියදම්	1,771,875.00	1,771,875.00
කාර්ය මණ්ඩල ප්‍රවාහනය	1,958,780.00	1,594,485.00
භාණ්ඩ තොග - 5000ට පහළ	1,215,573.39	2,167,807.81

උපදේශන ගාස්තු	27,500.00	50,000.00
පරිත්‍යාග - ශිෂ්‍ය විභාගය	45,000.00	45,000.00
පරිත්‍යාග - විශ්වවිද්‍යාල ප්‍රවේශය	45,000.00	
සෙසු කාර්යාලයීය වියදම්	5,151,065.31	5,094,334.90
	12,095,582.81	18,862,402.82

සටහන 21 - මූල්‍ය ආදායම

	2015 **එකතුව රු.**	2014 **එකතුව රු.**
මහජන බැංකුව - ගාලු පාර	52,440,860.69	39,019,694.73
මහජන බැංකුව (පාරිතෝෂික අරමුදල)	2,526,552.76	3,706,802.22
භාණ්ඩාගාර බිල්පත් මත පොළිය	13,617,970.75	16,476,304.18
අතිරික්ත අරමුදල මත පොළිය		414,496.32
	68,585,384.20	59,617,297.45

සටහන 22 - ආදායම් බදු

අංක 2006 දරන දේශීය ආදායම් පනතේ 07 (ආ) වගන්තිය ප්‍රකාර භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ආදායම් බදු ගෙවීමට බැඳී සිටී. ඒ අනුව, 2015 වර්ෂය සඳහා රු. 18,496,473ක් ගෙවා ඇත.

විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } අයිර්එන්/ඩී/ජීඑස්එම්බී/1/15/2 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2016 නොවැම්බර් [illegible] දින

සභාපති,

භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය.

භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 18(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කාර්යාංශයේ සභාපති වෙත 2016 සැප්තැම්බර් 02 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

AGDSL

2

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01

මූල්‍ය ප්‍රකාශනවල පාරිතෝෂික වෙන්කිරීම් අනාවරණය කිරීමේදී විශ්‍රාම ගන්වන වයස ඉක්මවූ සේවකයින්ට ගෙවිය යුතු පාරිතෝෂිකය ජංගම වගකීම් ලෙසත් ඉතිරිය ජංගම නොවන වගකීම් ලෙසත් නිරූපනය කිරීම වෙනුවට රු. 125,128,193 ක් වූ මුළු පාරිතෝෂික වෙන්කිරීම, ජංගම නොවන වගකීම් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී අදාල වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් ඊට පටහැනිව දැනට භාවිතා කරනු ලබන ධාරණ අගය ශුන්‍ය වූ වත්කම් පමණක් ප්‍රත්‍යාගණනය කර රු.26,361,994 ක ප්‍රාග්ධන ලාභයක් සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

4

2.2.2 සම්බන්ධිත පාර්ශව සමඟ ඇති ගණුදෙනු හෙළිදරව් නොකිරීම

කාර්යාංශයට සියයට 66 ක හිමිකමක් ඇති අනුබද්ධිත ආයතනයකින් සේවකයින් 105 දෙනෙකු කුලී පදනමට ලබාගෙන එම සමාගම වෙත සමාලෝචිත වර්ෂයේදී රු. 37,344,658 ක් ගෙවීම හා කාර්යාංශයේ පරිශ්‍රයක එම ආයතනය පවත්වාගෙන යාම වෙනුවෙන් රු. 1,230,325 ක ආදායම් ලැබීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් අනාවරණය කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සංවර්ධන පිරිවැය ගිණුම්ගත කිරීම සඳහා යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වා දී නොතිබුණ අතර පද්ධති අධ්‍යනයක් සිදුකිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට වර්ෂ තුනකට පෙර ගෙවා තිබුණු රු.1,505,000 ක් මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් හඳුනාගැනීමේදී වත්කමේ ජීවකාලය හඳුනාගෙන නොතිබූ බැවින් ඉකුත් වර්ෂවල පාරිභෝජනය කළ රු. 10,687,383 ක් වූ පාරිභෝගික ද්‍රව්‍ය තවදුරටත් ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි.

(ආ) සේවාදයකයා වෙනුවෙන් මිලදීගෙන ඔවුන් විසින් ප්‍රතිපූරණය කරන ලද රු. 2,046,540 ක් වටිනා වත්කම් කාර්යාංශයේ වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සේවක සුභසාධනය සඳහා ප්‍රදානයක් ලෙස ලැබී තිබුණු රු.1,321,648 ක මුදලක් සේවක ශුභසාධනය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන අරමුදලට බැර කළ යුතු වුවත් දේශීය ප්‍රදාන ගිණුමට බැර කර තිබුණි.

(ඈ) කාර්යාංශය විසින් රු.130,476,703 ක් ගෙවා මිලදී ගෙන තිබූ ඔරුගොඩවත්ත ඉඩම රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවරාගෙන තිබියදී මූල්‍ය ප්‍රකාශනවල තවදුරටත් ජංගම නොවන වත්කමක් ලෙස නිරූපණය කර තිබුණි.

2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වර්ෂ පහ ඉක්මවූ එකතුව රු.3,312,205 ක් වූ ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට හා එකතුව රු.4,218,727 ක් වූ ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය	නියමිත අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.231,784,375 ක මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල හා එකතුව රු.823,562,324 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.
(ආ) 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ II වන කොටසේ 6(2)(අ) ඡේදය	මාසයක දළ වැටුප මත පාරිතෝෂික ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී නිලධාරියෙකුට රු.609,070 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය (i) XXIV වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය හා 2008 දෙසැම්බර් 31 දිනැති අංක 142 දරන ජාතික අයවැය චක්‍රලේඛය	මාසික මූලික වැටුප පදනම් කර ගෙන ආපදා ණය ගෙවිය යුතු වුවත් දීමනා ඇතුළත් මාසික දළ වැටුප පදනම් කරගෙන රු. 250,000 ඉක්මවා ආපදා ණය ගෙවා තිබූ අතර ඒ අනුව ගෙවිය හැකි මුදල ඉක්මවා රු. 9,053,927 ක් වැඩිපුර ගෙවා තිබුණි.

6

(ii) XXX පරිච්ඡේදයේ 1.4 හා 1.4.1 වගන්ති	ලේකම්වරයාගේ අවසරයකින් තොරව නිලධාරීන් තිදෙනෙකු විසින් කාර්යාංශයට අනුබද්ධිත ආයතනයකට වෘත්තිමය සේවා සැපයීම සිදුකර සමාලෝචිත වර්ෂයේදී රු.1,969,500 ක් උපයාඉගන තිබුණද ආයතන සංග්‍රහයේ විධිවිධානය පරිදි රාජ්‍ය භාග ගෙවීමට කටයුතු කර නොතිබුණි.
(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 104 (2)	සමාලෝචිත වර්ෂයේදී කාර්යාංශයේ සිදු වූ වාහන අනතුරු 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඉ) 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 01/2010/01 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 6 (iii) වගන්තිය	නියමිත සංයුක්ත දීමනාව ඉක්මවා කාර්යාංශයේ නිලධාරීන් 9 දෙනෙකු වෙත රු. 469,300 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.
(ඊ) 1996 අගෝස්තු 02 දිනැති අංක පීඊ1/000/6 දරන භාණ්ඩාගාර ලිපිය	දිරිදීමනා ගෙවීම සඳහා භූ විද්‍යා හා ඛනිජ ගවේෂණවලින් ලැබෙන ශුද්ධ ඉපයීම් පමණක් භාවිතා කළ යුතු වුවත් පරීක්ෂණ ගාස්තු හා පරීක්ෂණ පිපුරුම් ගාස්තු ආදායම වූ රු. 144,724,836 ක්ද දිරිදීමනා ගෙවීම සඳහා යොදාගෙන තිබුණි.
(උ) 2015 සැප්තැම්බර් 10 දිනැති විනිමය පාලකගේ අවසර දීමේ ලිපිය 2(b), 4 හා 5 වගන්ති	සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයේ ආරම්භ කර තිබූ විශේෂ විදේශ විනිමය ගිණුමෙන් දේශීය ගෙවීම් ශ්‍රී ලංකා මුදලින් කළ යුතු වුවත් ඊට පටහැනිව දේශීය ආයතනයක් වෙත ඇ.එ.ඩො. 105,402 ක් ගෙවා තිබුණු අතර එම ගිණුම 2016 ජනවාරි 14 දින දක්වා පමණක් පවත්වාගෙන යාමට

7

විනිමය පාලක විසින් අවසර දී තිබුණද විගණිත දිනය වූ 2016 මැයි මාසය වනවිටත් ගිණුම පවත්වා ගෙනගොස් තිබුණි. තවද එම ගිණුම් විස්තර හා ඊට අදාළ ගෙවීම් විස්තර විනිමය පාලක වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,037,093,870 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.826,918,428 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.210,175,442 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මෙම වර්ධනය කෙරෙහි රාජ්‍ය භාග ආදායම රු.159,831,410 කින් හා පරීක්ෂණ ගාස්තු ආදායම රු.42,431,093 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵලය විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ ලාභයේ අඩුවීමක් පෙන්නුම් කලද 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩව ලාභයේ වර්ධනයක් නිරීක්ෂණය විය. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී කාර්යාංශයේ දායකත්වය 2011 වර්ෂයේ රු.821,150,804 ක් වූ අතර 2015 වර්ෂයේදී රු.1,547,924,501 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

කාර්යාංශයට විරුද්ධව බාහිර පාර්ශවයන් නඩු 13 ක් පවරා තිබූ අතර කාර්යාංශය විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 02 ක් පවරා තිබුණි.

8

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත අනුව ඛනිජ ගවේෂණය, පතල් කැනීම, ඒවා ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, වෙළඳාම් කිරීම හෝ අපනයනය විධිමත් කිරීම කාර්යාංශයේ ප්‍රධාන අරමුණු විය.

(අ) කාර්යාංශයේ කාර්යයන් අතරින් භූ විද්‍යා සිතියම් සකස් කිරීම, ඛනිජ සම්පත් හඳුනාගැනීම සහ ඒවා තක්සේරු කිරීමේ කටයුතුවල ප්‍රගතිය මන්දගාමී තත්ත්වයක තිබූ අතර පතල් කැනීමේ වාණිජමය ශක්‍යතාවය පිළිබඳව ඇගයීම සහ ඛනිජ සකස් කිරීම හා අපනයනය, වාණිජමය පදනමක් මත ඛනිජ නිෂ්කර්ෂණය කිරීම සහ නිෂ්පාදනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා උපයෝගී කරගත යුතු පියවර සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම යන කාර්යයන් කිසිවක් සිදුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සැලසුම්කළ 1: 50,000 භූ රසායනික සිතියම් වැඩසටහන යටතේ වව්නියාව, පාන්කුලම, මහඔය, රක්වාන හා තංගල්ල ප්‍රදේශවල කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි. තවද පළාත් ඛනිජ සමීක්ෂණ වැඩසටහනේ සබරගමුව පළාතට අදාළව කිසිදු ක්‍රියාකාරකමක්ද සිදුකර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය භාග මුදල් අය කිරීම.

(i) නවීන තාක්ෂණික ක්‍රමවේද භාවිතාකිරීම වෙනුවට පුපුරණ ද්‍රව්‍ය පාලක වාර්තා පදනම්කරගෙන රාජ්‍ය භාග ගණනය කිරීම හේතුවෙන් කලුගල් කැනීම් වෙනුවෙන් සැලකිය යුතු රාජ්‍ය භාග මුදලක් අහිමිවීමේ අවධානමක් ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

9

(ii) බලපත්‍රයේ සඳහන් අනුමත ප්‍රමාණය ඉක්මවා කැනීම් කර ඇති අවස්ථාවලදී ඊට අදාල නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හා වැඩිපුර කැනීම් කර ඇති ප්‍රමාණය සඳහා රාජ්‍ය භාගය අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට කාර්යාංශය අවධානය යොමු කර නොතිබුණි.

(iii) කාර්යාංශය විසින් ඛනිජ ද්‍රව්‍යවල වෙළඳපල වටිනාකම පදනම් කරගෙන රාජ්‍ය භාග ගණනය කළද 2011 වර්ෂයෙන් පසුව එම අගයන් සංශෝධනය කිරීමට කළමනාකරණය විසින් ක්‍රියාකර නොතිබුණි.

(ආ) බලපත්‍ර නිකුත් කිරීම හා ගාස්තු අය කිරීම.

(i) බලපත්‍රයක් නිකුත් කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට පෙර අයදුම්පත සමඟ සම්පූර්ණ බලපත්‍ර ගාස්තුවත් ඊට අදාල එකතු කළ අගය මත බදු හා මුද්දර ගාස්තුද අයකර තිබුණි. මීට අමතරව බලපත්‍රය මගින් කැනීම් කරන ඛණිජ ප්‍රමාණය මත අයකළ යුතු රාජ්‍ය භාගය සඳහා අත්තිකාරම් මුදලක් අයකර තිබුණි. මේ හේතුවෙන් බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි අයදුම්පත්වලට අදාලව විශාල මුදලක් කාර්යාංශයේ නිරන්තරයෙන් සමුච්චිතව පැවතුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට එකතු අගය රු 111,348,683 ක අත්තිකාරම් ශේෂයක් විය.

(ii) නීති විරෝධී කැනීම් පාලනය සඳහා වැටලීම් ඒකකයක් ස්ථාපිත කර නොතිබීම නිසා දීප ව්‍යාප්තව නිරන්තරයෙන් අනවසර කැනීම් සිදු වුවත් ඒ සඳහා නිත්‍යානුකූලව කටයුතු කිරීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි.

(ඇ) කැනීම් භූමි පුනරුත්ථාපනය සඳහා ලබාගන්නා බැංකු ඇපකරවල වටිනාකම තීරණය කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් දක්නට නොතිබුණි.

(ඈ) විවිධ රටවල භූ විද්‍යාඥයින්ගේ සංගම් 13 කින් 2013 හා 2014 වර්ෂවල විද්‍යාත්මක ජ'නල් මිලදීගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 3,633,770 ක් වියදම් කර තිබුණි. වර්ෂයට අදාල ජ'නල් වර්ෂයේම මිලදී නොගෙන දීර්ඝ කාලයක් ගත වීමෙන් අනතුරුව මිලදීගෙන තිබූ අතර ආයතනය ඉන් ලබා ගන්නා ප්‍රයෝජන විගණනයට සනාථ නොවුණි.

10

(ඉ) යක්කල ගබඩාවේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ සඳහන් නිරීක්ෂණ හා ඊට අදාල නිර්දේශ ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය පියවර පාලන අධිකාරිය විසින් ගෙන නොතිබූ අතර භාණ්ඩ වර්ග 412 ක ඒකක 9,925 ක ඌනතාවය තක්සේරු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) භූ විදුම් ව්‍යාපෘති සඳහා සේවාදායකයින් ලබා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබූ අතර ආයතනික මට්ටමින් ව්‍යාපෘති ලබාගැනීම සඳහා ප්‍රවර්ධන කටයුතු සිදු කර නොතිබුණි. මේ හේතුවෙන් පෙර වර්ෂය හා සැසදීමේදී භූ විදුම් ව්‍යාපෘති ආදායම සියයට 27 කින් පමණ අඩු වී තිබුණි.

(උ) භූ කම්පන මාන කුළුණු නඩත්තු වෙනුවෙන් 2000 වර්ෂයේ සිට විදේශයකින් ලැබී තිබූ මුදල්වලින් සමාලෝචිත වර්ෂය වන විට රු. 6,887,885 ක් කාර්යාංශය තුළ එකතු වී තිබුණි. මෙම මුදල් අදාල පාර්ශව වෙත ගෙවීමට හෝ ආදායමට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඌ) අන්තර්ජාතික න්‍යෂ්ඨික අවිහරණ සම්මුති සංවිධානයේ (CTBTO) සමුළුවක දේශීය අනුග්‍රහකත්වය කාර්යාංශය විසින් සිදුකර තිබුණි. හෝටල් පහසුකම් වෙන්කිරීමට අදාල ප්‍රසම්පාදන කටයුතු විනිවිදභාවයකින් සිදුකර නොතිබූ අතර ලංසු ඉදිරිපත් කළ ආයතන දෙකක පැවැත්ම තහවුරු කිරීමට කාර්යාංශය අපොහොසත් විය. තවද එකඟ වූ ලංසු මිලගණන් ඉක්මවා රු.284,000 ක් ගෙවීම් සිදුකර තිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පල්ලෙකැලේ භූ කම්පනමාන කුළුණු නඩත්තු කටයුතු සඳහා වූ අවබෝධතා ගිවිසුමට පටහැනිව රු. 215,372 ක විවිධ දේශීය බදු විදේශ ජංගම ගිණුමෙන් ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී දිරිදීමනා ලෙස ගෙවූ රු.56,915,835 ක මුදල ගණනය සඳහා පෞද්ගලික විගණන සමාගමකින් විගණනය කරන ලද ගිණුමක් භාවිතා කර තිබූ අතර එහි ලාභය විගණකාධිපති වෙත ලබා දී තිබූ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ව්‍යාපෘති ලාභයට වඩා රු. 31,951,689 කින් වැඩියෙන් දක්වා තිබුණි. තවද එහි ලැබිය යුතු ආදායම් ලෙස ඇතුළත් කර තිබූ රු.8,973,399 ක මුදලක් 2016 අප්‍රේල් වන විටත් අයකරගෙන නොතිබුණි.

(ඇ) කාර්යාංශයේ සේවය නොකරන නිළධාරීන් දෙදෙනෙකු විදේශ පුහුණුවකට යැවීම වෙනුවෙන් සංයුක්ත දීමනා හා වෙනත් වියදම් ලෙස කාර්යාංශය විසින් රු. 953,258 ක් දරා තිබුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ නිළධාරීන් සිව්දෙනෙකු අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වී පසුව ගිවිසුම් ප්‍රකාරව අනිවාර්ය සේවාකාලය සම්පූර්ණ නොකර කාර්යාංශයෙන් ඉවත්වීම් මත අයකර ගත යුතු දණ්ඩන මුදල් සහ අනෙකුත් වියදම් ලෙස රු. 2,921,783 ක් අයකර ගැනීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) නව කාර්ය මණ්ඩලය හා සංවිධාන ව්‍යුහය 2013 ජුනි 28 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබූ අතර ඊට අදාළ බඳවාගැනීමේ කාර්ය පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමුකර අනුමත කර නොගැනීම හේතුවෙන් පැරණි බඳවාගැනීමේ කාර්ය පරිපාටිය පදනම් කරගෙන නිළධාරීන් සඳහා උසස් වීම් ප්‍රදානය කර තිබුණි.

4.5 හඳුනාගන්නා ලද පාඩු

හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු විසින් ලබාගෙන තිබූ රු. 597,231 ක් වටිනා උපකරණ ආපසු භාර දී නොතිබූ අතර එම අලාභ අයකරගැනීමට පියවර ගෙන නොතිබුණි.

4.6 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම

ඉඩමේ සිදුකරන සංවර්ධනයන් හා ඉදිකිරීම්වල අයිතිය බදු කාලය අවසානයේ බදු දීමනාකරුට හිමිවන බවත් ඒ සම්බන්ධයෙන් කිසිදු දීමනාවක් ඉල්ලා සිටීමට බදු ගැණුම්කරුට අයිතියක් නොමැති බවත් ගිවිසුමේ සඳහන්ව තිබියදී කාර්යාංශය විසින් කල්බදු පදනම මත ලබාගෙන තිබූ ඉඩමක රු. 46,035,957 ක් වැය කර ගොඩනැගිලි 02 ක් ඉදිකර තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන කාර්යය සඳහා කාර්යාංශයේ සභාපතිවරයාට වගකියන විගණකවරයෙකු පත් කර ඇතත් ඔහුට සහාය වීම සඳහා ස්ථිර විගණන කාර්ය මණ්ඩලයක් පත් කර නොතිබූ අතර අභ්‍යන්තර විගණකගේ විගණනය පිළිබඳ වෘත්තීය දැනුම වර්ධනය කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන විමසුම් හයකට අදාල අංශ විසින් පිළිතුරු දී නොතිබූ අතර විගණන අනාවරණයන් පිළිබඳ ඉදිරි කටයුතුවල ප්‍රගතිය සමාලෝචනය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් දක්නට නොතිබුණි.

5.2 නොවිසඳී ඇති විගණන ඡේද

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට මුහුදු වැලි කැනීම සඳහා නිකුත් කර තිබුණු බලපත්‍රයක් වෙනුවෙන් 2013 හා 2104 වර්ෂ සඳහා අයවිය යුතු රු. 44,727,062 ක් වූ රාජ්‍යභාග හා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම එම ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට තොග සමීක්ෂණ වාර්තාවල සඳහන් වූ ඝන මීටර් 2,269,563 ක වැලි තොගයක් සඳහා අයවිය යුතු රු. මිලියන 100 කට අධික රාජ්‍ය භාග මුදල්ද අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

5.3 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 16 සිට සියයට 4,812 ක පරාසයක් දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2013 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව 2016 මැයි මාසය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ)	ගිණුම්කරණය	තොග භෞතිකව සත්‍යාපනය කර ගිණුම්ගත නොකිරීම.
(ආ)	කාර්ය මණ්ඩල පරිපාලනය	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර විධිමත් පරිදි බඳවාගැනීම සිදුකර නොතිබීම.
(ඇ)	තොග පාලනය	භාණ්ඩ ගබඩාවට භාරගැනීමෙන් තොරව සෘජුව අදාල අංශ වෙත නිකුත්කිරීම.
(ඈ)	ස්ථාවර වත්කම් පාලනය	විදේශ වලින් ලැබෙන උපකරණ ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත නොකිරීම.

14

(ඉ)	මෙහෙයුම් පාලනය	(i)	ක්ෂේත්‍ර රාජකාරි ගමන් තහවුරු කර නොගැනීම.
		(ii)	ධාවනය පිළිබඳ තහවුරු කර ගැනීමකින් තොරව ඉන්ධන වියදම් ගෙවීම.
		(iii)	නීතිවිරෝධි කැනීම් සිදුවීම හා බලපත්‍ර කොන්දේසි කඩවීම් සම්බන්ධයෙන් පරීක්ෂණ වාර්තාවලින් අනාවරණය නොකිරීම.
(ඊ)	බලපත්‍ර නිකුත් කිරීම්	(i)	පාරිසරික නිරවුල් සහතික ලබා නොගෙන බලපත්‍ර නිකුත්කිරීම.
		(ii)	බලපත්‍ර පසුවිපරම් දුර්වල වීම.
		(iii)	ව්‍යාජ අත්සන් මත ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම හා අයදුම්පත් භාරගැනීම සඳහා ලේඛනයක් නඩත්තු කර නොතිබීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

2017.01.05
ඔබේ අංකය :- අයිඊච්න්/ඞී/ජීඑස්එම්බී/1/15/2

විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර,

බත්තරමුල්ල.

<u>භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව හා සම්බන්ධ කාර්යාංශයේ පැහැදිලි කිරීම්</u>

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01

විගණනය පෙන්වා ඇති පරිදි ඉදිරියේදී පාරිතෝෂික වෙන් කිරීම් අනාවරණය කිරීමේදී ජංගම වගකීම් සහ ජංගම නොවන වගකීම් ලෙස පෙන්නුම් කිරීමට සටහන් කර ගතිමු.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 07

විගණනය පෙන්වා දුන් පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව අදාල වත්කම් පන්තියම ප්‍රත්‍යාගණය කිරීමට පියවර ගෙන ඇත.

2.2.2 සම්බන්ධිත පාර්ශව සමඟ ඇති ගණුදෙනු හෙළිදරව් නොකිරීම

කාර්යාංශයේ සේවක අවශ්‍යතාවය මත අනුබද්ධිත ආයතනය මඟින් සේවකයින් ලබාගෙන ඇති අතර ඒ සඳහා වූ වියදම් නිවැරදිව ගිණුම් ගතකර ඇත. මෙය බාහිර ආයතනයකින් සේවා ලබාගැනීමක් වන බැවින් සටහන් මඟින් නොව වියදමක් ලෙස පෙන්විය යුතුව ඇත. එමෙන්ම එම ආයතනය පවත්වාගෙන යන ගොඩනැගිලි කුලිය ද නිවැරදිව වෙනත් ආදායමක් ලෙස ගිණුම් ගත කර ඇත.

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

අදාල ප්‍රතියාන්ත්‍රණය කිරීමේ මෘදුකාංග වර්තමානයේ තවදුරටත් සංවර්ධනය වී ඇති නිසාත් ඉදිරිපත් වූ මිළ ඉතා අධික වූ බැවින් ද අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වූයේ වර්තමානයට ගැලපෙන ලෙස යොමු කිරීමේ අනුදේශ (TOR) නැවත සකසා නැවතත් ටෙන්ඩර් කැඳවීම යෝග්‍ය බවය. ඒ අනුව මෙම කාර්යය තවදුරටත් කෙරීගෙන යන කාර්යයකි.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

(අ) තොග ලේඛණයට භාණ්ඩ ඇතුළත් කිරීමේදී යම් යම් අතපසු වීම් මත පාරිභෝගික භාණ්ඩ ස්ථාවර වත්කම් ලෙස ඇතුළත් වී ඇත. ඊට අදාලව නිවැරදි කිරීම් සිදුකිරීමට අවශ්‍ය පියවර ගන්නෙමු.

(ආ) ව්‍යාපෘති සඳහා වන සේවාදායකයන් සඳහා මිළදී ගත් එම වත්කම් ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

(ඇ) මෙය අතපසුවීමකින් සිදුවී ඇති අතර, එය මේ වනවිට නිවැරදි කර ඇත.

(ඈ) කාර්යාංශය විසින් මිළදී ගෙන තිබූ ඔරුගොඩවත්ත ඉඩම රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් පවරා ගෙන ඇත. එයට හිලව් වශයෙන් බත්තරමුල්ලෙන් කාර්යාංශයට ලැබුන ඉඩමත් මෙයට කලින් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලත් ඉඩමත් යන දෙකම පරිසර අමාත්‍යාංශයට ලබාදී, පරිසර අමාත්‍යාංශය සතු දැනට කාර්යාංශය පවත්වාගෙන යනු ලබන එපිටමුල්ල පාර පිටකෝට්ටේ පිහිටි භූමිය සහ ගොඩනැගිල්ල කාර්යාංශයට නීත්‍යානුකූලව පැවරීමේ කටයුතු මේ වනවිට සිදුවෙමින් පවතී. ඒ අනුව ඔරුගොඩවත්ත සහ බත්තරමුල්ල යන ඉඩම් ඉවත්කර අදාල නව වත්කම් නිවැරදිව ගිණුම් ගත කිරීමට පියවර ගනු ලැබේ.

2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

මෙම රු.3,312,205 ක මුදලින් රු.1,618,483 ක මුදල් රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු මුදල් වේ. මෙම මුදල් ලබාගැනීම සඳහා එම ආයතන සමඟ නිරන්තර සාකච්ඡා පවත්වමින් සිටී. පෞද්ගලික ආයතන වලින් ලැබිය යුතු අනෙකුත් මුදල් ලබාගැනීම සඳහා මේ වනවිට ලිපි යවා ඇත. ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කාර්යාංශය අදහස් කර සිටී.

2.3. නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

(අ) කාර්යාංශය රජයේ මුදල් මත යැපෙන ආයතනයක් නොවන අතර කාර්යාංශයේ ඉදිරි වැඩ කටයුතු වලට සහ හදිසි තත්වයක් තුල ආයතනයට මුදල් උපයා ගත නොහැකි වුවහොත් සේවකයින්ගේ වැටුප් සහ අර්ථසාධක මුදල් සඳහා අවශ්‍ය මුදල් පමණක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර ඇත. ඉතිරි මුදල් රාජ්‍ය බැංකුවල ස්ථිර තැන්පතු ලෙස ආයෝජනය කිරීමට භාණ්ඩාගාරය අනුමැතිය ලබාදී ඇත.

තවද කාර්යාංශය මෙහිදී කටයුතු කර ඇත්තේ 1992 අංක 33 දරණ පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන වලට අනුකූලව වන අතර, අතිරික්ත මුදල් වාර්ෂිකව මහා භාණ්ඩාගාරය වෙත යැවීම සිදුවේ.

(ආ) 1983 අංක 12 දරණ පාරිතෝෂික පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව අවමය ඉක්මවා පාරිතෝෂික ගෙවීමට කාර්යාංශය පනතට හැකි බව පාරිතෝෂික පනත පිළිබඳව තීරක වන කම්කරු කොමසාරිස් දන්වා ඇත. ඒ අනුව පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත මඟින් සේවක පාරිතෝෂික ගෙවීම සඳහා කාර්යාංශයට ලබාදී ඇති බලතල අනුව කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දීර්ග සේවයකින් පසුව විශ්‍රාම යන සේවකයින්හට පාරිතෝෂික සීමාව වැඩිකර ඇති අතර ඒ අනුව නියමිත අනුමත මුදල පමණක් ගෙවා ඇති අතර වැඩිපුර ගෙවීමක් සිදුවී නැත.

(ඇ) (i). විගණනය දක්වා ඇති මෙම කරුණ පිළිබඳව කාර්යාංශය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් විමසීම් කරන ලදී. එහිදී කාර්යාංශයට දන්වා ඇත්තේ ආපදා ණය ගෙවීම සඳහා භාණ්ඩාගාර අරමුදල් භාවිතා නොකරන බැවින් හා ඊට ප්‍රමාණවත් ප්‍රතිපාදන කාර්යාංශය සතු බැවින්, ජාතික අයවැය චක්‍රලේඛ 05/2014 කාර්යාංශයට අදාල කර ගැනීම අවශ්‍ය නොවන බවය. ඒ අනුව ගෙවිය හැකි මුදල ඉක්මවා වැඩිපුර ගෙවීමක් සිදුව නැත.

(ii) ආයතන සංග්‍රහයේ ○○○ 1.4.1 හි දක්වා ඇත්තේ රජයේ නිලධාරීන් සම්බන්ධවය. ආයතන සංග්‍රහයේ 1 පරිච්ඡේදයේ දක්වා ඇති අර්ථ නිරූපණයට අනුව කාර්යාංශ සේවකයින් රාජ්‍ය නිලධාරීන්ගේ ගණයට අයත් නොවන බව කාර්යාංශයේ අදහසයි. මේ පිළිබඳව කාර්යාංශය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින් පැහැදිලි කරගැනීමට අදහස් කරමු.

(ඈ) අංක 104 (2)

කාර්යාංශයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නෙමු.

(ඉ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් අනුමැතිය ලද සීමාවන් මත මෙම ගෙවීම් සිදුව ඇත.

(ඊ) ගල් පිපිරවීමට අවශ්‍ය නිර්දේශ ලබාදීමේදී පරීක්ෂණ පිපිරුමක් මගින් නිර්දේශ කල හැකි සීමාව හා ගල් ප්‍රමාණය අධ්‍යනය කරන අතර, එය හුදෙක් ගවේෂණ කටයුත්තක් වේ. ඒ අනුව මාසිකව කැඩිය හැකි ගල් සංචිත ප්‍රමාණයද ගණනය කරනු ලැබේ. වැලි නිධි සම්බන්ධව මෙම ක්‍රියාවලියම සිදුවේ. මේ අනුව පරීක්ෂණ පිපිරුමට අදාල ගාස්තුව සහ පරීක්ෂණ ගාස්තු ගවේෂණ ගාස්තුවක් ලෙස සැලකිය යුතුය.

(උ) මෙම වියදම් රජයේ මුදල් වලින් සිදුකර නොමැති අතර, සියළුම වියදම් න්‍යෂ්ඨික අවිහරණය පිළිබඳ සම්මුති සංගමය (CTBTO) මඟින් දරා ඇත. CTBTO ආයතනයේ උපදෙස් අනුව කාර්යාංශය විසින් විධිමත් ලෙස අවශ්‍ය උපදෙස් බැංකුව වෙත ලබාදී ඇති අතර, හෝටල් පහසුකම් ලබාදීමේදී අදාල දේශීය හෝටල් වල මිල ගණන් ඇ.එ.ඩො. වලින් දක්වා තිබුණි.

මෙම ගිවිසුම හරහා ගෙවිය යුතු සියලුම වියදම් 2016 ජනවාරි 14 දිනට පෙර නිම කරන ලදී. එම

ගණුදෙනුවලට අදාළ බිල්පත් ආදිය CTBTO ආයතනය වෙත ඉදිරිපත් කර ශේෂ වූ මුදල් නැවත යැවීමට ඔවුන්ගේ අනුමැතිය ලැබෙන තුරු මහජන බැංකුව හා සාකච්ඡා කර දිගටම පවත්වාගෙන යන ලදී. සියලුම මුදල් ගනුදෙනු පිළිබඳව CTBTO ආයතනයෙන් අනුමැතිය ලැබෙන තුරු එම විස්තර විනිමය පාලක වෙත යැවීම සිදු නොකල අතර ගිණුම 2016.06.07 දින

වසා දැමීමෙන් පසු ඒ පිළිබඳ විනිමය පාලක වෙත දැන්වීමට කටයුතු කරන ලදී.

3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

විගණනය පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදී නඩු පිළිබඳව මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කිරීමට සටහන් කර ගනිමු.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) ඛනිජ ද්‍රව්‍ය මත පදනම්වූ නිෂ්පාදන සංවර්ධනය කිරීම මගින් ප්‍රවර්ධනය කිරීම, නිශ්කර්ශණය කිරීම, වටිනාකම එකතු කිරීම සඳහා සහ වාණිජමය පදනමක් මත එකී ඛනිජ ද්‍රව්‍ය පදනම් වූ නිෂ්පාදනය, අපනයනය යනාදී කරුණු සම්බන්ධව විෂයභාර අමාත්‍යතුමා සහ නියෝජ්‍ය අමාත්‍යතුමා හා අමාත්‍යාංශය සමග නිරතුරුව සාකච්ඡා කරන අතර, එහි ප්‍රතිඵලයන් ලෙස වරින්වර පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත සංශෝධනය, රෙගුලාසි සංශෝධනය යනාදිය සිදුකර ඇත.

(ආ) රජයේ අවශ්‍යතාවය මත වකුගඩු රෝගය වඩාත් ව්‍යාප්තව පවතින පොළොන්නරුව, කවුඩුල්ල හා කැකිරාව ප්‍රදේශවලට ප්‍රමුඛත්වයදීම සඳහා 2015 ක්‍රියාකාරී සැලැස්මේදී වවුනියාව, පාන්කුලම ප්‍රදේශ වෙනුවට පොළොන්නරුව, කවුඩුල්ල හා කැකිරාව ප්‍රදේශ භූ රසායණික සිතියම් කරන වැඩ සටහනට තෝරාගෙන තිබුණි. කෙසේ වෙතත් 2017 වර්ෂයේ මුල් කාර්තුවේදී වව්නියාව, පාන්කුලම් හා මහ ඔය ප්‍රදේශ වල පස් සාම්පල නැවත එක්රැස් කිරීමේ කටයුතු නැවත ඇරඹීමට යෝජිතය.

4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

(අ)(i) කාර්යාංශය විසින් කලුගල් සඳහා රාජ්‍ය භාගය ගණනය කිරීම වර්තමානයේ සිදුකරනු ලබන්නේ, පුපුරන ද්‍රව්‍ය මත පදනම්ව සිදුකරනු ලබන ක්‍රමවේදයකි. මෙම ක්‍රමවේදය මගින් තාක්ෂණික වශයෙන් නිවැරදි තොරතුරු සාර්ථකව ලබාගත හැකිවේ. එමගින් සැලකිය යුතු රාජ්‍ය භාගයක් අයකිරීමට හැකිවී ඇත. A ශ්‍රේණියේ කළුගල් වලවල් පිළිබද අධීක්ෂණ කටයුතු තවදුරටත් තීව්ර කොට මෙම ක්‍රමවේදයේ යම් යම් අඩුපාඩු තිබේ නම් ඉදිරියේදී නිවැරදි කිරීමට අපේක්ෂා කෙරේ.

(ii) කැණීම් බලපත්‍ර වල කොන්දේසි මත කැනීම් කටයුතු සිදුවන්නේද යන්න අධීක්ෂණය සඳහා විශ්‍රාමලත් නිලධාරීන් දෙදෙනෙකු මේ වනවිට බඳවා ගෙන ඇති අතර එම නිලධාරීන් විසින් මේ වනවිට කැනීම් බලපත්‍ර සම්බන්ධව අධීක්ෂණ කටයුතු සිදුකරනු ලබයි. තවද මෙම බලපත්‍රලාභීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන ඇත. කාර්යාංශයේ පනතට අදාල රෙගුලාසි මේ වනවිට සංශෝධනය වෙමින් පවතී.

(iii) 2011 වසරින් පසු ඛනිජවල වෙළඳපොළ මිල සංශෝධනය නොකලද, රාජ්‍ය භාග අගය 2 % සිට 4% අතර අගයකින් ඉහළ නැංවූ අතර, මේ මගින් රාජ්‍ය භාග ආදායම දෙගුණයකින් වැඩිවී ඇත. මෙම සංශෝධනයන් ඉදිකිරීම් කර්මාන්තයට සෘජු බලපෑමක් සිදුවන බැවින්, කාලානුරූපව වෙළඳ පොළ මිළ අධ්‍යනයෙන් පසුව නැවත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. වැලි සඳහා වන වෙළඳ පොළ වටිනාකමට ප්‍රවාහන වියදම්ද ඇතුළත්වී ඇති බැවින් මෙයද සැලකිල්ලට ගෙන ඛණිජ සඳහා වෙළඳ පොළ වටිනාකම සංශෝධනය කිරීම වඩාත් ප්‍රායෝගික වන බව කාර්යාංශයේ අදහස වී ඇත.

(ආ) (i) කාර්යාංශය විසින් කැනීම් බලපත්‍ර වෙනුවෙන් අයදුම්පත් භාරගැනීමෙන් පසුව අදාල ආයතන වල නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරන අතර අවශ්‍ය නිර්දේශයන් නොමැතිව කැනීම් බලපත්‍ර නිකුත් කරනු නොලැබේ. මෙහිදී වෙනත් ආයතන මගින් ලබාගත යුතු නිර්දේශ ප්‍රමාදවීම් වැනි කරුණු මත බලපත්‍ර ලබාදීම ප්‍රමාද විය හැකි අතර එහිදී ලබාගත් අත්තිකාරම් ආදායම් ලෙස ගැනීමේ ප්‍රමාදයක් වන බැවින් මෙලෙස අත්තිකාරම් ශේෂයන් පැවතිය හැක.

(ii) මේ වනවිට විශේෂ කාර්ය බලකායේ නිලධාරීන්ගෙන් සමන්විත විමර්ශන ඒකකය ස්ථාපිත කර ඇති අතර, එම නිලධාරීන් විසින් මේ වනවිට අදාල කාර්යයන් සාර්ථකව සිදුකරමින් පවතී.

(ඇ) කැනීම් බලපත්‍රයක් යටතේ කැණීම් කරනු ලබන භූමිය ප්‍රතිසංස්කරණය කල යුතු වන අවස්ථාවලදී පමණක් කාර්යාංශය විසින් බලපත්‍රලාභියාගෙන් ඒ වෙනුවෙන් බැංකු ඇපකරයක් ලබාගනී.

(ඈ) මෙම විද්‍යාත්මක වාර සඟරා මිලදී ගැනීමට අවශ්‍යවන්නේ ශ්‍රී ලංකාව තුළ භූ විද්‍යාව හා ඒ ආශ්‍රිත විෂය ක්ෂේත්‍රයන්ට අදාළව ක්‍රියාත්මක වන එකම රාජ්‍ය ආයතනය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වීමයි. මෙහි සඳහන් විෂය ක්ෂේත්‍රයේ කාලීන තොරතුරු දැන ගැනීමටත්, පර්යේෂණ කිරීමේදීත් මෙවැනි විද්‍යාත්මක වාර සඟරා භාවිතා කිරීම අත්‍යාවශ්‍යය. මෙවැනි විද්‍යාත්මක වාර සඟරා කාර්යාංශයේ භූ විද්‍යාඥයින්, කැණීම් ඉංජිනේරුවන්, භූ භෞතික විද්‍යාඥයින්, රසඥයින් ඔවුන්ගේ පර්යේෂණ කාර්යයන් වලදී මෙන්ම ආයතනයේ නොයෙකුත් සංවර්ධන ව්‍යාපෘති සඳහාද නිරන්තරයෙන් භාවිතා කරනු ලැබේ.

එපමණක්ද නොව විශ්වවිද්‍යාල සිසුන්, දේශීය හා විදේශීය පර්යේෂකයින්, පාසල් සිසුන්, විෂය ක්ෂේත්‍රයට සම්බන්ධ පෞද්ගලික අංශයේ ආයෝජකයින් මෙම විද්‍යාත්මක වාර සඟරා භාවිතා කරනු ලබයි. ඒ සියළු දෙනාගේ තොරතුරු අවශ්‍යතා හැකි උපරිම මට්ටමෙන් ඉටු කරදීමට මෙවැනි වාර සඟරා මිලදී ගැනීම අත්‍යාවශ්‍යය. එය ජාතික වගකීමකි.

(ඉ) විගණනය පෙන්වා දුන් පරිදි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා මඟින් ලබාදෙන නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගතිමු.

(ඊ) භූ විදුම් ව්‍යාපෘති සඳහා සේවාදායකයන් ලෙස ක්‍රියාකරනුයේ උමං, වේලි හා වෙනත් සිවිල් ඉංජිනේරුමය ඉදිකිරීම් සඳහා දායක වන මහවැලි අමාත්‍යාංශය, විදුලිබල මණ්ඩලය වැනි සුවිශේෂී රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන වන අතර, අප කාර්යාංශයේ විදුම් කටයුතු පිළිබඳව අදාල ආයතන දැනටමත් දැනුවත් කොට ඇත. මේ හැරුණු විට ප්‍රවර්ධන කටයුතු සිදුකිරීම සෘජුව ව්‍යාපෘති ලබාගන්නා ලෙස භූ විද්‍යා අංශයේ ව්‍යාපෘති ඒකක භාර නිලධාරීන්ට මේ වනවිටත් දැනුවත් කර ඇත.

(උ) භූ කම්පන මාන කුළුණු විදේශ රටවලින් ලැබූ ප්‍රධානයන්වේ. ඒවායේ පූර්ණ හිමිකාරිත්වය සහ නඩත්තු කටයුතු සිදුකරනුයේ එම රටවලිනි. එම උපකරණ නඩත්තු සඳහා මෙම මුදල් යෙදවීම සිදුවේ. මෙය ආපසු ගෙවීමට හැකිවනුයේ මෙම ක්‍රියාවලිය අවසන් වුවහොත් පමණි.

(ඌ) 2015 මැයි/ජුනි මාස වලදී හෝටල් කාමර පිළිබඳව මිළ ගණන් කැඳවන ලද අතර, එම අවස්ථාවේදී මෙම සමුළුව සඳහා සාමාජිකයින් 100 සහභාගී වන බව අන්තර් ජාතික න්‍යෂ්ඨික අවිහරණ සංවිධානය (CTBTO) දැනුම් දුන් අතර, ඒ අනුව මිළ ගණන් කැඳවන ලදී. එම අවස්ථාවේදී සැපයුම්කරු ලෙස තොරා ගත් ආයතනය ලබාදුන් මිළ ගණන් අනුව එක් කාමරයක් වෙනුවෙන්

ඇ.එ.ඩො. 199 ක් විය. එහෙත් 2015 ඔක්තෝබර් මස ක්‍රමිඔධ ආයතනය විසින් දැනුම් දෙන ලද්දේ සමුළුවට සාමාජිකයින් 80 කට ආසන්න ප්‍රමාණයක් පමණක් සහභාගිවන බවයි. සැපයුම්කරු විසින් ඒ වනවිට කාමර වෙන් කර තිබූ අතර, සාමාජිකයින් සංඛ්‍යාව අඩු වුවත් ඔවුන්ට ඒ සඳහා මුදල් ගෙවීමට සිදුවී ඇත. එසේම සාමාජිකයින් සංඛ්‍යාව අඩුවීමේදී මිළ ගණන් වැඩිවීමක් ද සිදුවී ඇත. ඒ අනුව කාමරයක නව මිළ ඇමරිකන් ඩොලර් 202 ක් වූ අතර, ඒ අනුව ගෙවීම් සිදුකර ඇත.

එනම් දිනකට ඇ.එ.ඩො. 199 බැගින් කාමර 100 ක් දින 08 තුල භාවිතා කිරීමට නියමිතව තිබුණද සාමාජිකයින් සංඛ්‍යාව අඩුවීම නිසා කාමරයක දිනක මිල ඇ.එ.ඩො. 202 දක්වා ඉහළ ගිය ඇ.එ.ඩො. 25130 ක් (රු.3,643,850) වූ වියදම ඇත්තමේන්තු මුදලට වඩා අඩු වූ බැවින් මුදල් ඉතිරියක් කර ගැනීමට හැකිවිය.

මෙහිදී කාමර වෙන් කිරීම මෙන්ම කාමර පහසුකම් ලබාදෙන පුද්ගලයින්ගේ නාම ලේඛනය CTBTO ආයතනයේ නිලධාරීන්ගේ නිර්දේශය මත සිදුකරන ලදී. පුහුණුවන්නන්, පුහුණුකරවන්නන් සහ පහසුකම් සලසන නිලධාරීන්ට අමතරව සමුළුවේ ආරම්භක සහ අවසාන දිනයන්හි ආරාධිත අමුත්තන් ද සහභාගිවූ අතර, ඔවුන් සඳහා ද නවාතැන් පහසුකම් ලබා දෙන ලදී.

තවද CTBTO ආයතනයේ නිර්දේශය මත මෙම වැඩසටහනේ අවසාන දිනය දක්වා රතුකුරුස සංවිධානයේ නිලධාරීන්, පොලිස් නිළධාරීන් සහ මාධ්‍යවේදීන් සඳහාද මෙම කාමර පහසුකම් ලබාදෙන ලදී. එහිදී ඒකපුද්ගල කාමර වෙනුවට ඔවුන් සඳහා ද්විත්ව කාමර ලබාදී තිබූ අතර එමගින් ඇ.එ.ඩො. 3,900 (රු.565,500) ක ඉතිරියක් සිදුකර ඇත. .

මෙම සමුළුවට සහභාගි වූ ඇතැම් සාමාජිකයින් දෙසැම්බර් 27 දින ශ්‍රී ලංකාවට ලගාවූ අතර, ඔවුන් වෙනුවෙන් දෙසැම්බර් මස 27 දින රාත්‍රියේ Taj Gateway හෝටලයේ නවාතැන් පහසුකම් ලබාදුනි. විදේශීය සාමාජිකයින් එක් එක් වෙලාවන්හිදී ශ්‍රී ලංකාවට ලගාවූ අතර වෙන වෙනම දඹුල්ල වෙත රැගෙන යාම වියදම් අධික හෙයින් ගුවන් තොටුපල අසල රඳවා කණ්ඩායමක් ලෙස දඹුල්ල වෙත කැඳවාගෙන යාම ප්‍රායෝගික ක්‍රමය විය. ඒ අනුව දෙසැම්බර් මස 28 දින කන්ඩලම හෝටලය වෙත ඔවුන් කැඳවාගෙන යන ලදී. එක් එක් පුද්ගලයා බැගින් ගුවන්තොටුපලේ සිට කණ්ඩලම හෝටලය දක්වා ප්‍රවාහන පහසුකම් ලබාදී, කණ්ඩලම හෝටලයේ නවාතැන් පහසුකම් ලබාදීමට කටයුතු කලේ නම්, මෙම මුදලට වඩා රුපියල් ලක්ෂයකට වඩා වැඩි මුදලක් වැය වීමට ඉඩ තිබුණි.

එසේම මෙම ජාත්‍යන්තර වැඩමුළුව ජාතික වශයෙන් ඉතාමත් වැදගත් වන වැඩසටහනක් වන අතර එයට අතිගරු ජනාධිපතිතුමාද සහභාගිවීමට නියමිතව තිබූ අතර, රටට අවශ්‍ය කීර්තිය සහ වැඩසටහනේ ඇති වැදගත් කම තහවුරු කිරීම සඳහා විෂය පිළිබඳ දැනුම ඇති විශේෂිතවූ ආරාධිතයන් කිහිප දෙනෙකුට ආරාධනා කළ අතර, ඒ සඳහා නවාතැන් පහසුකම් ලබාදීමට ද සිදුවිය.

මෙම මුළු ක්‍රියාවලිය සඳහා රජයේ මුදල් වැය නොවූ අතර, සියළු වියදම් CTBTO ආයතනය මඟින් ලබාදෙන ලද මුදල් වලින්ම පියවීමට හැකිවිය.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

(අ) විගණනය පෙන්වා දෙන පරිදි අවබෝධතා ගිවිසුමට පටහැනිව කටයුතු කර නොමැත.

(ආ) මෙම වෙනසට හේතු වන්නේ දිරි දීමනා ගෙවීමේදී මුදල් බවට පත්වූ ව්‍යාපෘති ආදායම් පමණක් සැලකිල්ලට ගැනීමය. ඒ අනුව 2014 වර්ෂයේ ව්‍යාපෘති වලට අදාල අගයන් 2014 අවසන් ගිණුමට ගෙන ඇති නමුත්, දිරි දීමනා ගෙවීමේදී 2014 වර්ෂයට අදාලව සහ 2015 වර්ෂයේදී 2014 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති වලට අදාලව ලැබුණු මුදල් ආදායම ගෙන ඇත. විගණනය විසින් දක්වා ඇති ලැබිය යුතු රු. 8,973,399 ක ව්‍යාපෘති ආදායම් වලින් රු. 7,747,321 මේ වනවිට ලැබී ඇත. රජයේ ආයතන වලින් ලැබිය යුතු මුදල් මෙලෙස බොහෝවිට ප්‍රමාද වී ලැබේ.

(ඇ) අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය මගින් පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශ ලේකම් වෙත කර ඇති ඉල්ලීමක් මත බලශක්ති හා පරිසර නීතිය පිළිබඳව වන ජාත්‍යන්තර සමුළුව සඳහා ශ්‍රී ලංකා අධිකරණයේ විනිශ්චයකාර වරුන් දෙදෙනෙකු සඳහා පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගේ ඉල්ලීම මත පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් කාර්යාංශයෙන් කරන ලද ඉල්ලීමක් මත මෙම ගෙවීම් සිදුකර ඇත.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) අදාල නිලධාරීන්ට අයකර ගත යුතු දණ්ඩන මුදල ගෙවන ලෙස දන්වා ලිපියවා ඇති අතර, ඔවුන් විසින් ගෙවීම් නොකළහොත්, එම මුදල් ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට තීරණය කර ඇත.

(ආ) කාර්යාංශය විසින් මෙම බඳවා ගැනීමේ පටිපාටිය කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යැවීම සඳහා 2014.02.28 දින මහවැලි සංවර්ධන පරිසර අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. මෙය කඩිනමින් අමාත්‍යාංශය විසින් කළමණාකරන දෙපාර්තමේන්තුව වෙත යවනු ඇතැයි කාර්යාංශය අපේක්ෂා කරයි.

4.5 හදුනාගන්නා ලද පාඩු

මේ කරුණ සම්බන්ධව සොයා බැලීම සඳහා 2015 ඔක්තෝබර් 13 දින තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවකට වෙත යොමු කල අතර, එහිදී අනාවරණය වූයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් වරයා එවැනි භාණ්ඩයන් ලබාගෙන නොමැති බවයි.

4.6 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම

මෙය රජයට අයත් ඉඩමකට අදාලව වේ. රජයේ ඉඩම් ව්‍යවස්ථාපිත ආයතන සඳහා ලබාදෙනු ලබන්නේ බදු පදනම මත මිස පූර්ණ අයිතිය මත නොවේ.

බදු කාලය තුළ ගිවිසුමේ 04 වගන්තියට අනුකූලව ඉඩම සංවර්ධනය කිරීම සඳහා අදාළ රජයේ ආයතනයන්ගේ අනුමැතිය යටතේ බදු ගැනුම්කරුට හැකි වේ. ගිවිසුම් කාලය අවසානයේදී හෝ ගිවිසුමේ 17 වන හා 18 වගන්ති ප්‍රකාරව බද්ද කලින් අවසාන වීමකදී එම ඉඩමෙහි කරන ලද සංවර්ධන කටයුතු බදු දීමනාකරුට හිමි වේ.

කෙසේ වුවද රජයේ අවශ්‍යතාවයන් සඳහා ඉඩම හෝ කොටසක් පවරා ගැනීමට තීරණය කරන අවස්ථාවකදී 16 (i) වගන්තියට අනුව රජයට ගනු ලබන කොටසට අදාළව, ගෙවන ලද බදු මුදල් හා සිදු කරන ලද සංවර්ධන කටයුතු වලට සරිලන වන්දියක් ලබා ගැනීමට බදු ගැනුම්කරුට හැකියාවක් ඇත.

5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

(අ) කාර්යාංශයේ අභ්‍යන්තර විගණන අංශයට දැනට අනුයුක්තව රාජකාරි කරන නිලධාරීන් අ.පො.ස. (උ.පෙළ) වාණිජ අංශයෙන් සමත්ව ඇති අතර බාහිර උපාධි සමත්, වරලත් ගණකාධිකාරි විභාග සඳහා පෙනී සිටින සහ වෙනත් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ලිපිකරුවන්ද සිටී. මෙම ලිපිකරුවන් වසර 10 කට වැඩි කාලයක් අඛණ්ඩව විගණන අංශයේ රාජකාරි කිරීම් තුළින් ලබා ගත් ප්‍රායෝගික පුහුණුවට අමතරව බාහිර ආයතනවල පුහුණු වැඩ සටහන් වලට සහභාගී වීමෙන් න්‍යායික පුහුණුවද ලබා ඇත.

විගණනය දක්වා ඇති පරිදි ඉදිරියේදී ක්‍රමවත් පුහුණු වැඩ සටහනක් සකස් කර අවශ්‍ය පුහුණුව ලබා දීමට කටයුතු කරනු ඇත.

(ආ) විගණන විමසුම් සියල්ලටම පිළිතුරු මේ වනවිට ලබාදී ඇත. විගණනය පෙන්වා දුන් කරුණු සම්බන්ධව ප්‍රගති සමාලෝචන කටයුතු ඇති කිරීමට ඉදිරියේදී පියවර ගනු ලැබේ.

5.2 නොවිසඳී ඇති විගණන ඡේද

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මගින් කනිනු ලැබූ වැලි නිධි ප්‍රමාණය කාර්යාංශයට දන්වා සිටි අතර, ඒ අනුව 1992 අංක 33 දරණ පනත හා ඒ යටතේ ඇති රෙගුලාසි වලට අනුකූලව රාජ්‍ය භාග ගණනය කර ගෙවිය යුතු රාජ්‍ය භාගය ගෙවීමට කටයුතු කරන ලෙස එම ආයතනය වෙත දැනටමත් දන්වා යවා ඇත.

5.3 අයවැය ලේඛනමය පාලනය

මෙලෙස ආදායම 4812% ක පරාසයකට වැඩිවී ඇත්තේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ලැබෙන ආදායම විධිමත්ව හා කාර්යක්ෂමව ලබාගැනීමට කාර්යාංශය ගත් පියවර හේතුකොට ගෙනය. වියදම් වල ඊට සාපේක්ෂව යම් වැඩිවීමක් සිදුවීමද අනිවාර්ය සිදුවීමකි.

5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2013 වාර්ෂික වාර්තාව 2016.09.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. 2014 වාර්ෂික වාර්තාව 2016.06.16 දින අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.

6 පද්ධති හා පලනයන්

විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි පද්ධති හා පාලන ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීමට විශේෂ අවධානය යොමුකිරීමට සටහන් කර ගතිමු.

ආචාර්ය කිත්සිරි දිසානායක

සභාපති

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

පිටපත් :- ලේකම් - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

ලේකම් - මුදල් අමාත්‍යාංශය

විගණන කමිටු වාර්තාව

යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ තුළ අන්තර්ගත මෙහෙයුම් මූලධර්ම මත පදනම් වූ විගණන හා කළමනාකරණ කමිටුවෙහි ප්‍රඥප්තිය තුළ පැහැදිලිව විස්තර කර ඇති භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි විගණන කමිටුවෙහි නීති හා වගකීම්

මෙම කමිටුව කළමනාකරණ කමිටුවට වගකිව යුතු වන අතර කමිටුවෙහි කටයුතු නියාමන මණ්ඩලයට වාර්තා කළ යුතු වේ.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි විගණන කමිටුව කළමනාකරණ කමිටු සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර භාණ්ඩාගාර නියෝජිතයෙකු විසින් එහි මුලසුන දරනු ලැබේ. එකී සාමාජිකයන් පහත සඳහන් වේ.

1. සභාපති - පී. අල්ගම මහතා

(අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුව)

2. සාමාජික - එන්. කේ. පී. කේ. නැම්මවත්ත මහතා

(අතිරේක ලේකම් - පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය)

3. සාමාජික - ඩබ්. ටී. එච්. ආර්. විතාන මහතා

(අධ්‍යක්ෂ - කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය)

විගණන හා කළමනාකරණ කමිටුවෙහි නීති හා වගකීම්

ආයතනයෙහි මූල්‍ය හා අනිකුත් කටයුතු වලට අදාළව තම වගකීම් කාර්යසාධක ලෙස සපුරාලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම විගණන හා කළමනාකරණ කමිටුව විසින් සිදු කරනු ලැබේ. පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට කමිටුව වෙත බලතල පැවරී ඇත.

1. වාර්ෂික විගණන සැලැස්ම, වැඩසටහන, ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම, වාර්ෂික අයවැය සහ ප්‍රාග්ධන අයවැය සමාලෝචනය කිරීම
2. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය හා ගුණාත්මකභාවය හා ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ක්‍රියා පිළිවෙත්වල සිදු කරනු ලබන යම් යම් නෙස්කම් සහ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අදාළ ව්‍යවස්ථාපිත හා නියාමන අනුකූලතාවයන්ට ඒවා අනුගත ද යන වග සමාලෝචනය කිරීම
3. විගණන වාර්තා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ කළමනාකරණ තීරණ මත පදනම්ව ගිණුම්කරණ, මූල්‍ය සහ මෙහෙයුම් යන අංශ ආවරණය කරනු ලබන අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම හා ඇගයීම
4. ව්‍යවස්ථා, නීති, රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛන සහ නියෝගවල අනුකූලතාවය සමාලෝචනය කිරීම
5. කමිටුවෙහි නිර්දේශ කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කිරීම
6. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පිරිවැය කෙරෙහි සංවේදි සහ ඵලදායී ආයතනයක් බවට පත් කිරීමේ අරමුණ ඇතිව දූෂණ ක්‍රියා හා අනවශ්‍ය වියදම් දුරලීම, ආයතනයේ කාර්යසාධනය සහ ආයතන කාර්ය මණ්ඩලයේ විනය යන කරුණු සමාලෝචනය කිරීම.

7. වංචා ඇතිවීම පිබඳ අවදානම දුරලීම සඳහා යෝග්‍ය විමර්ශන කටයුතු සිදු කිරීම

කමිටුවෙහි රැස්වීම්

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ දී කමිටුවෙහි රැස්වීම් හතරක් පවත්වන ලදී. කමිටුවෙහි රැස්වීම් කටයුතු පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් පරිදි වාර්තා කර තබනු ලබන අතර ඒවා අඛණ්ඩව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ. කමිටු සාමාජිකයන් රැස්වීම් සඳහා සහභාගි වීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ. කමිටුවෙහි ආරාධනය මත විගණකාධිපති දෙපාර්තමේන්තුවෙහි නියෝජිතයෙකු අදාළ වර්ෂය තුළදී කමිටු රැස්වීම් සඳහා සහභාගි විය.

2015 දෙසැම්බර් මස 31 දිනට විගණන හා කළමනාකරණ කමිටුවෙහි සංයුතිය

2015 වර්ෂය තුළ පවත්වන ලද මුළු රැස්වීම් සංඛ්‍යාව සඳහා සහභාගිත්වය

පී. අල්ගම මහතා	4
එන්. කේ. පී. කේ. නැම්මවත්ත	4
ඩබ්ලිව්. ටී. එච්. ආර්. විතාන	4

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණකයෙකුගේ ප්‍රධානත්වයෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි අභ්‍යන්තර විගණන අංශය ක්‍රියාත්මක වේ. අභ්‍යන්තර විගණක වැඩසටහන ඉදිරිපත් කරන ලදුව විගණන හා කළමනාකරණ කමිටුව විසින් අනුමත කරන ලද අතර කමිටුව විසින් නිතිපතා අභ්‍යන්තර විගණන හා පරීක්ෂණ කටයුතු සමාලෝචනය කිරීම හා අධීක්ෂණය කිරීම සිදු කරනු ලැබේ.

බාහිර විගණනය

අක්‍රමවත් විගණන කටයුතු හා අනනුකූලතාවයන් පිලිබඳව වාර්තාවන සිද්ධීන් සඳහා නිසි කලට විසඳුම් ලබා දීම සඳහා විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා විගණන හා කළමනාකරණ කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබේ.

නිගමනය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි අභ්‍යන්තර පාලන කටයුතු කාර්යසාධක ලෙස ක්‍රියාත්මක වන බවට සහ ආයතනයේ වත්කම් ප්‍රමාණවත් ලෙස ආරක්ෂා කරනු ලබන බවට විගණන හා කළමනාකරණ කමිටුව සෑහීමට පත් වෙයි. අභ්‍යන්තර විගණන අංශය වර්ෂය පුරාවටම කාර්යසාධක හා ස්වාධීන ආකාරයකින් කටයුතු කර ඇති බවටද කමිටුව සෑහීමට පත් වෙයි. මීට අමතරව ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීම සුදුසු පරිදි සිදු කරනු ලබන බවටද කමිටුව සෑහීමට පත් වන අතර ඒ අනුව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි මූල්‍ය ප්‍රකාශන විශ්වසනීය බවට සාධාරණ තහවුරු කිරීමක් ලබා දෙනු ලැබේ. තවද සමාලෝචිත වර්ෂය තුළදී වාර්තා වූ සියළුම අනුකූලතාවයන් සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ හා නිවාරණ පියවර ගනු ලබන බවට සහ සියලුම අදාල නීති රීති හා රෙගුලාසි වලට අනුකූලව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය කටයුතු කරනු ලබන බවට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි අනුකූලතා කාර්ය රාමුව විසින් තහවුරු කරනු ඇති බවට කමිටුව සෑහීමට පත් වෙයි.

විගණන හා කළමණාකරණ කමිටුව විසින් මෙම වාර්තාව 2016-10-25 දින අනුමත කරන ලදී.

පී. අල්ගම මහතා
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව

ආයතනික සමාජ වගකීම්

අධ්‍යාපන වැඩසටහන්

(අ) කැනීම් අංශය විසින් සංවිධානය කරන ලද වැඩමුළු හා සම්මන්ත්‍රණ

කැනීම් කටයුතුවලට අදාළ ප්‍රධාන කාර්මික ගැටළු නිරාකරණය කිරීමට සහ පතල් හා ඛනිජ පනත ප්‍රකාරව කාර්යාංශයෙහි නියාමන කටයුතු පිළිබඳ රාජ්‍ය ආයතන හා බලපත්‍රලාභීන් දැනුවත් කිරීම සඳහා පතල් අංශය විසින් වැඩමුළු හා සම්මන්ත්‍රණ කිහිපයක් පවත්වන ලදී. මෙම වැඩමුළුවල ප්‍රධාන අරමුණ වූයේ පතල් හා ඛනිජ පනත ක්‍රියාත්මක කිරීමේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි අනෙකුත් රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීමයි.

(ආ) ප්‍රතිසංස්කරණ වැඩසටහන

(අ) කැළණි ගඟෙහි බෝට්ටු අංකනය කිරීමේ වැඩසටහන - කොළඹ දිස්ත්‍රික්කය

කොළඹ දිස්ත්‍රික්කයට අදාළව කැළණි ගඟෙහි ගමන් කරනු ලබන බෝට්ටු අංකනය කිරීමේ වැඩසටහනක් 2015 ජූනි මාසයේදී ක්‍රියාත්මක කරන ලදී. මෙහි ප්‍රධාන අරමුණු වූයේ අනවසර කැනීම් කටයුතු අවම කිරීම සහ ගංගා ඉවුරු ආරක්ෂා කිරීමයි. කැළණි ගඟෙහි බලපත්‍ර ලබා දීමේ ක්‍රියා පටිපාටීන්, දැනට පවතින නීති සහ බලපත්‍ර ලබා දීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ රෙගුලාසි සම්බන්ධයෙන් බලපත්‍ර හිමියන් හා රජයේ ආයතන දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පවත්වන ලදී.

(ආ) මහඔය ගංගා ඉවුරු ප්‍රතිසංස්කරණය

සාමාන්‍යයෙන් සිදු කරනු ලබන පශ්චාත් කැනීම් කටයුතුවලට අමතරව පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරණ කටයුතු කිහිපයක් අදාළ කාල පරිච්ඡේදය තුළදී සිදු කරන ලදී. ගම්පහ දිස්ත්‍රික්කයෙහි විශේෂයෙන්ම මහඔය තුලින් ජල ගැලීම් ඇතිවන තැනිතලා ප්‍රදේශය තුළ මෙවැනි කටයුතු කිහිපයක් ප්‍රමුඛ ලෙස සිදු කරන ලදී. මුරුතැන්න සහ ජම්බුගස්වත්ත යන ගංගා ඉවුරු ප්‍රදේශවල කලින් කලට සිදුවන හායනය වීම වැළැක්වීම සඳහා ප්‍රතිසංස්කරණ කටයුතු සාර්ථක ලෙස සිදු කරන ලදී.

මහඔය - දිවුලපිටිය ගංගා ඉවුරු ප්‍රතිසංස්කරණ කටයුතු



කටාන මුරුතැන්න ප්‍රදේශයෙහි සිදු කරන ලද මහඔය ප්‍රතිසංස්කරණ ආකෘතිය

(ඇ) දොඩංගොඩ තුඩුගල කන්ද ප්‍රදේශයෙහි ගල් කඩන ස්ථානවල ප්‍රතිසංස්කරණ කටයුතු



දොඩංගොඩ තුඩුගල කන්ද ප්‍රදේශයෙහි ගල් කඩන ස්ථානයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ රූපසටහන්මය නිරූපණය

gsmb.gov.lk

GSMB

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
වාර්ෂික වාර්තාව
www.gsmb.gov.lk

BP Chandimal